ඉච්චා 'දයො බුද්ධ සද්දෙ'ච

පුන්නාග, දෙඹගය; පූග, පුවක්ගස; පනස, කොස්ගස; අසන, පියා ගස; චම්පක, සපුගස; අම්බ, අඹගස; හින්තාල, හින්තාල්ගස; තාල, තල්ගස වකුල, මුනමල්ගස; අජ්ජුන, කුඹුක්ගස; කිංසුකා ච, කැලය මන්දාර, මදුරාගස; කුන්ද, කොඳගස; පුචිමන්ද, කොහොඹගස; කරඤ්ජ,කරඳ ගස; රුක්ඛා, වෘක්ෂයෝ; මයූර, මොනරුය; සකුණ, පක්ෂීය; අණ්ඩජ, බිජුවටින් හටගන්නා සත්වයෝය; කොඤ්ච, කොස් ලිහිනිය; හංසා, හංසයෝය;- ඉතිආදයො, මේආදී ශබ්දයෝ; එවං, මෙසේ බුද්ධසද්දෙව, බුද්ධශබ්දයා මෙන්; ඤෙයයා, දතයුතුයී

එවං මඝවා කුලවා ඵලවා යසවා ධනවා සුතවා භගවා හිමවා බලවා සීලවා පඤ්ඤවා සතිමා ධිතිමා ගතිමා මුතිමා ජුතිමා හිරිමා ධුතිමා යතිමා සුචිමා කලිමා බලිමා කසිමා රුචිමා බුද්ධිමා චක්ඛුමා බන්ධුමා හෙතුමා සෙතුමා කෙතුමා රාහුමා භානුමා ඛානුමා විජ්ජුමා ඉච්චාදයො ගුණවන්තුසද්ද සමා

මඝවා, මඝය නම්ඇතේතේ හෝ පූජාඇත්තේය; (ශක්‍රයායී) කුලවා, කුලහෝ වංශඇත්තේය; ඵලවා, ඵලඇත්තේය; යසවා, යසස්හෝ ඉසුරු ඇත්තේය; ධනවා, වස්තුඇත්තේය; සුතවා, ඇසූතැන් නොහොත් පුත්‍රයන් ඇත්තේය; භගවා, භාග්‍ය ඇත්තේය; (සර්වඥයී) හිමවා, පිනිඇත්තේය; (හිමාලයයී) බලවා, බලඇත්තේය; සීලවා, සිල්ඇත්තේය; පඤ්ඤවා, නුවනැත්තේය; සතිමා; සිහිඇත්තේය; ධිතිමා. ධෛර්‍යඇත්තේය; ගතිමා, ගතිඇත්තේය; මුතිමා,මිදීම හෙවත් සිහිකිරීම ඇත්තේය; ජුතිමා, සෝභාඇත්තේය; හිරිමා, ලජ්ජාඇත්තේය; ධුතිමා, සතුති ඇත්තේය; යතිමා, යතීඇත්තේය; සුචිමා, පවිත්‍රඇත්තේය; කලිමා, පව්ඇත්තේය; බලිමා, බලිඇත්තේය; කසිමා සීසෑම් ඇත්තේය; රුචිමා, කැමතිඇත්තේය; බුද්ධිමා, නුවන ඇත්තේය; චක්ඛුමා, ඇස්ඇත්තේය; බන්ධුමා, නෑයන්ඇත්තේය; හෙතුමා, කාරණඇත්තේය; සෙතුමා, සෙයඇත්තේය; කෙතුමා,ධජඇත්තේය; රාහුමා, රාහුඇත්තේය; භානුමා, රශ්මිඇත්තේය; ඛානුමා, කණුඇත්තේය; විජ්ජුමා, විදුලිය ඇත්තේය; ඉති, මෙසේ; එවං ආදයො, මේආදී (ශබ්දයෝ) ගුණවන්තු සද්ද සමා, ගුණවන්තු ශබ්දයහා සමානයෝයී

එවං මහං චරං තිට්ඨං, දදං භුඤ්ජං සුණං පචං
ජයං ජීරං චවං මීයං සරං කුබ්බං ජපං වජං.

ඉච්චාදයො ගච්ඡන්ත සද්දසමා.

මහං, පූජාකරන්නේය; චරං, හැසිරෙන්නේය; තිට්ඨං, සිටින්

නේය; දදං දෙන්නේය; භුඤ්ජං, අනුභව කරන්නේය; සුණං අසන්නේය; වචං කියනනේය; ජයං, දිනන්නේය; ජීරං, දිරන්නේය; චවං, චුතවන්නේය; මීයං, මැරෙන්නේය; සරං, සිහි කරන්නේය; කුබ්බං, කරන්නේය; ජපං, ජපකරන්නේය; වජං, යන්නේය; ඉති, මෙසේ; එවං ආදයො, මේආදී (ශබ්දයෝ)ගච්ඡන්තාසද්දසමා, ගච්ඡන්ත ශබ්දයහා සමාණයෝයි—

මහන්ත ශබ්දාදියෙන් දුජ්කරණ කෙනෙක් ආදී සබ්දයෝ කියනු ලැබෙත්

යෝනී පාණී ගණ්ඨී මුට්ඨී, කුච්ඡී වත්ථී සාලි වීහි
ව්‍යාධි ඔධි බොධි සන්ධි, රාසි කෙසි සාතිදීපි.

යෝනි, බැබලීමය; පාණී අත්ලය; ගණ්ඨී, ගැටය; මුට්ඨී, මිටය; කුච්ඡී, කුසය; වත්ථී. වස්තිකොෂය; සාලි, හැල්ය; වීහි, වීය. ව්‍යාධි, ලෙඩය; ඔධි, අවධිය; බොධි, බොධිය; සන්ධි, සන්ධිය; රාසි, සමූහය; කෙසි, ධජය; සාති, එනම් ධජයකි; දීපි, දිවියාය;

ඉසි මුනි මණී ධනි ගිරි රවි කවි කපි
අසි මසි නිධි විධි අහි කිමි පති හරි
අරි තිමි කලි බලි ජලනිධි ගහපති
උරුඹිනි වරමති නිරුපධි අධිපති
ඉච්චා'දයො අග්ගිසද්දෙ'ව.

ඉසි, ඍෂියා; මුනි, මුනිය හෝත් බුදුය; මණී, මැනිකය; ධනි, ශබ්දය; ගිරි, පර්වතය; රවි, හිරුය; කවි, කාව්‍යකාරයා හෝ පණ්ඩිතයාය; කපි, වඳුරාය; අසි, කඩුවය; මසි, කජ්ජලය හෙවත් දැලිදිය; නිධි, නිධානය; විධි, දෛවය හෙවත් පිනය; අහි, නාගයාය; කිමි, පණුවය; පති, ස්වාමියාය; හරි, සිංහයාය; අරි, සතුරාය; තිමි, එනම් මත්ස්‍යයාය; කලි, පාපය හෝ කිලුටය; බලි, බිලිපූජය; ජලනිධි, මුහුදය; ගහපති, ගෘහපතියාය; උරුඹිනි. මහත්වයෂ්ඨී හෝ ප්‍රශුවය; වරමති, උතුම් නුවන ඇත්තාය; නිරුපධි, උපධි රහිතය හෙවත් නිර්වාණය; අධිපති, (යමකින්) වැඩිසිටියාය; ඉති, මෙසේ; එවං ආදයො, මේආදීහු; අග්ගි සද්දෙ'ව, අග්ගි ශබ්දයාහා සමයි.

ධම්මී සඞ්ඛී ඤාණී හත්ථී, චක්කී පක්ඛී දණ්ඩී රට්ඨී
ඡත්තී මාලී වම්මී යොගී, භාගී භොගී කාමී සාමී.

ධම්මී, ධර්මය ඇත්තේය; සඞ්ඛී, සමූහ ඇත්තේය; ඤාණී, නුවන ඇත්තේය; හත්ථී, අත් ඇත්තේය; චක්ඛී, ඇස් ඇත්තේය;

පක්ඛී, පක්‍ෂ ඇත්තේය; ...ඨී, දළ ඇත්තේය; රට්ඨී, රට ඇත් තේය, ඡත්තී, ඡත්‍ර ඇත්තේය; මාලී, මාලා ඇත්තේය; වම්මී, වර්මහෙවත් සැට්ට ඇත්තේය; යෝගී, යෙදුම් ඇත්තේය; භාගී, කොටස් ඇත්තේය; භෝගී, සම්පත් ඇත්තේය; කාමී, කාම ඇත්තේය; සාමී, අධිපතියා.

ධජී ගණී සසී කුට්ඨී, ජටී යානී සුඛී සිඛී
දන්තී මන්තී කරී චාගී' කුසලී මුසලී බලී.

ධජී, ධජඇත්තේය; ගණී, සමූහ ඇත්තේය; සසී, සසලප ඇත්තේය; කුට්ඨී, කුෂ්ඨ ඇත්තේය; ජටී, ජටා ඇත්තේය; යානී, යාන ඇත්තේය; සුඛී, සැප ඇත්තේය; සිඛී, සිඛාකොඬා ඇත් තේය; දන්තී, දත් ඇත්තේය; මන්තී, මන්ත්‍රණ ඇත්තේය; කරී, අත් ඇත්තේය; චාගී, ත්‍යාගඇත්තේය; කුසලී, කුසල් ඇත් තේය; මුසලී, මොහොල් ඇත්තේය; බලී, ශක්ති ඇත්තේය;

පාපකාරී සත්තුඝාතී, මලලකාරී දීඝජීවී
ධම්මවාදී සීහනාදී, භුම්සායී සීඝයායී.

ඉච්චා'දයෝ දණ්ඩී සද්දසමා—

පාපකාරී, පව්කරණ සුලුය; සත්තුඝාතී, සතුන් නසන්නේය; මලලකාරී, මාලානිර්මහෝ මල්ලව පොර අල්ලන්නේය; දීඝ ජීවී, බොහෝකල් ජීවත්වන්නේය; ධම්මවාදී. දහම් කියන් නේය; සීහනාදී, සිංහනාද කරන්නේය; භුම්සායී, බිමහෝ නේය; සීඝයායී, වහා යන්නේය— ඉති ආදයො, මේආදී (ශබ්දයෝ); දණ්ඩී සද්දසමා, දණ්ඩී ශබ්දයහා සමානයෝය—

එවං සෙතු කෙතු භානු රාහු සංකු උච්ඡු වෙලු මච්චු සින්ධු මධු නෙරු මෙරු සත්තු කාරු හෙතු ජන්තු රුරු පටු ඉච්චාද යො භික්ඛු සද්දසමා.—

සෙතු, හෙය; කෙතු, ධජය; භානු, හිරුය; රාහු, එනම් අසුර යාය; සංකු, උලය; උච්ඡු, උක්ය; වෙලු, හුනය; මච්චු, මරුය; සින්ධු, මුහුදය මධු, මීහෝ එනම් අසුරයාය; නෙරු, නෙරුනම් පර්වතය; මෙරු, මහමෙරය; සත්තු, සතුරාය; කාරු,, සිල්පීය; හෙතු, කාරණය; ජන්තු, සත්වයෝය; රුරු එනම් මුවෝය; පටු, දක්‍ෂයාය— ඉති ආදයො, මේආදී ශබ්දයෝ; භික්ඛු සද්දසමා, භික්ඛු ශබ්දයහා සමානයෝය—

එවං කත්තු හත්තු නෙතු සොතු ඤාතු ජේතු දාතු ධාතු ගන්තු බොද්ධු විඤ්ඤාපෙතු සකාමන්ධාතු මහාමන්ධාතු ආදයො.

කත්තු, කරන්නාය; හත්තු, රක්‍ෂාකරන්නාය; නෙතු, නායකයාය; සොතු, අසන්නේය; ඤාතු, දන්නේය; ජේතු, දිනන්නේය; දතු, දෙන්නේය; ධාතු, (පඨවි ආදී) ධාතුය; නත්තු, මුනුබුරාය; බොද්ධු, දන්නේය; විඤ්ඤුපෙතු, දන්වන්නේය; සකමන්ධාතු, එනම් රජය; මහාමන්ධාතු, එනම් රජය; ආදයො, මේආදී (ශබ්දයෝ) එවං. මෙසේමය; හෙවත් භාතු ශබ්දයහා සමානයෝය.

එවං සයම්භූ වෙස්සභූ පරාභිභූ සහභූ ආදයො.

සයම්භූ, තමේම හටගත්තේය; වෙස්සභූ, එනම් සර්වඥය; පරාභිභූ, අනුන් මැඩපවත්වන්නේය; සහභූ, සමග උපන්නේය; ආදයො, මේආදීහු; එවං, මෙසේමය හෙවත් අභිභූ ශබ්දයහා සමානයෝය—

එවං මග්ගඤ්ඤූ ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ කාලඤ්ඤූ රත්තඤ්ඤූ මත්තඤ්ඤූ කතඤ්ඤූ තත්තඤ්ඤූ විදූ වෙදගූ පාරගූ ආදයො.

මග්ගඤ්ඤූ, මාර්ගය දන්නේය; ධම්මඤ්ඤූ, ධර්මය දන්නේය; අත්ථඤ්ඤූ. අර්ථ දන්නේය; කාලඤ්ඤූ, කල්දන්නේය; රත්තඤ්ඤූ, චිර රාත්‍රි දන්නේය; මත්තඤ්ඤූ, පමණදන්නේය; කතඤ්ඤූ, කෙළෙහි ගුණ දන්නේය; තත්තඤ්ඤූ, තතු දන්නේය; විදූ, දන්නේය; වෙදගූ, විශෙෂ යෙන් දන්නේ හෝ වෙදදන්නේය; පාරගූ, එතරට පැමිනියේය; ආදයො, මේආදී(ශබ්දයෝ) එවං, මෙසේය; හෙවත් සබ්බඤ්ඤූ ශබ්දයාමෙනි—

බුද්ධා'ත්තා රාජ ගුණවා, ගච්ඡන්ත'ග්ගි'දණ්ඩිච
භික්ඛුච ජන්තු සත්ථාච, නත්තාච පිතු භාතුච
අභිභූ සබ්බඤ්ඤූගො'ති, එවං පුල්ලිංග සංගහො.

බුද්ධ, බුද්ධශබ්දයද; අත්තා, අත්තාශබ්දයද; රාජ, රාජ ශබ්දයද; ගුණවා, ගුණවන්තු ශබ්දයද; ගච්ඡන්ත, ගච්ඡන්ත ශබ්දයද; අග්ගි, අග්ගිශබ්දයද; ආදි, ආදි ශබ්දයද; දණ්ඩී(ච), දණ්ඩී ශබ්දයද; භික්ඛු,(ච)භික්ඛු ශබ්දයද; ජන්තු, ජන්තු ශබ්දයද; සත්ථා,(ච), සත්ථු ශබ්දයද' නත්තා(ච), නත්තු ශබ්දයද; පිතු, පිතු ශබ්දයද; භාතු(ච), භාතු ශබ්දයද; අභිභූ, අභිභූ ශබ්දයද; සබ්බඤ්ඤූ, සබ්බඤ්ඤූ ශබ්දයද; ගො ඉති, ගො ශබ්දය දැයි

(යනමේ ශබ්දයෝ) එවං, මෙසේ; පුල්ලිඞ්ග සංගහො. පුල්ලිඞ්ග සංග්‍රහයයි—

## පුල්ලිඞ්ගා.

සද්ධා මෙධා පඤ්ඤා විජ්ජා, චින්තා මන්තා තණ්හා වීණා
ඉච්ඡා මුච්ඡා එජා මායා, මෙත්තා මත්තා සික්ඛා භික්ඛා.

සද්ධා, ශ්‍රද්ධාවය; මෙධා, ප්‍රඥාවය; පඤ්ඤා, නුවණය; විජ්ජා, විද්‍යාවය; චින්තා, සිතිවිලිය; මන්තා, දැනීම හෝ මන්ත්‍රණ ප්‍රඥාවය; තණ්හා, තෘෂ්ණාවය; වීණා, වීණාවය; ඉච්ඡා, කැමැත්තය; මුච්ඡා; මූර්ජාවය; එජා, තෘෂ්ණාවය; මායා, කෘත ප්‍රතිච්ඡාදන වඤ්චාවය; මෙත්තා, මෛත්‍රිය; මත්තා, ප්‍රමාණය; සික්ඛා, හික්මීමය; භික්ඛා, සිඟීමය—

ජංඝා ගීවා ජිව්හා වාචා, ජායා ආසා ගඞ්ගා නාවා
ගාථා සෙනා ලෙඛා සාලා, මාලා ඛෙලා පූජා ඛිඩ්ඩා.

ජංඝා, කෙණ්ඩය; ගීවා, ග්‍රීවය හෝ නයය; ජිව්හා, දිවය; වාචා ඉනපුලය; ජායා, සෙවනය; ආසා, තෘෂ්ණාවය; ගඞ්ගා, ගඞ්ගා නම් ගඟය; නාවා, නැවය; ගාථා, චතුපදදි ගාථාවය; සෙනා, බල සෙනඟය; ලෙඛා, රෙඛාවය; සාලා, ශාලාවය; මාලා, මල් දමය; ඛෙලා, කෙළය; පූජා, පිදීමය; ඛිඩ්ඩා, ක්‍රීඩාවය—

පිපාසා වෙදනා සඤ්ඤා, චෙතනා තසිනා පජා
දෙවතා වට්ටකා ගොධා. බලාකා පරිසා සභා.

පිපාසා, පවසය; වෙදනා, විඳීමය; සඤ්ඤා, සංඥාවය; චෙතනා, සිතිවිලිය; තසිනා, තෘෂ්ණාවය; පජා, සත්වයෝය; දෙවතා, දෙවියෝය; වට්ටකා, වට්ටුවෝය; ගොධා, ගොයාය; බලාකා, කණකොකිනා; පරිසා, පිරිසය; සභා, සභාවය—

ඌකා සෙඵාලිකා ලඞ්කා ,සලාකා වාළුකා සිඛා
විසාඛා විසිඛා සාඛා, වචා වංඣා ජටා ඝටා.

ඌකා, උකුණෝය; සෙඵාලිකා, එනම් ගසය; ලංකා, ලංකා විපය; සලාකා, ඉරට්ටය; වාලුකා, වැලිය; සිඛා, මුදුනය; විසාඛා, විසා නැකතය; විසිඛා, විථිය; සාඛා, අතුය; වචා වදකහය; වඤ්ඣා, වඳ ස්ත්‍රිය; ජටා, කෙස ජටාවය; ,ඝටා සමූහය—

ජෙට්ඨා සොණ්ඩා විතණ්ඩා'ච, කරුණා වනිතා ලතා
කථා නිද්දා සුධා රාධා, වාසනා සිංසපා පපා.

ජෙට්ඨා, වැඩිමහලු සහෝදරිය; සොණ්ඩා, ලොල් ස්ත්‍රිය; විතණ්ඩා(ච), ලොකායත ශාස්ත්‍රය; කරුණා, දයාවය; වනිතා, ස්ත්‍රිය; ලතා, වැලය; කථා, කථාවය; නිද්‍රා, නිදීමය; සුධා, අමෘතය; රාධා, ශ්‍රීකාන්තාව හෝ අනුර නැකතය; වාසනා, පෙර පුරුද්දය; සිංසපා, ඇට්ටේරියය; පපා. පැන් මඩුවය—

පභා සීමා ඛමා ජායා, ඛත්තියා සක්ඛරා සුරා
දෝලා තුලා සිලා ලීලා, ලාලේ'ලා මෙඛලා කලා.

පභා, ප්‍රභාවය; සීමා, ඉමය; ඛමා, ඉවසීමය; ජායා, සෙවනය; ඛත්තියා, රාජස්ත්‍රිය; සක්ඛරා, කැට ගල්ය; සුරා, රාය; දෝලා, හොවිලිය; තුලා, තරාදිය හෝ සියක් පලම්ය; සිලා, ගලය; ලීලා, ලීලාවය; ලාලා, කෙළය; එලා, එන්සාල්ය; මෙඛලා, මෙවුල්දමය; කලා, කලාශාස්ත්‍රය—

වලවා 'ලම්බුසා මූසා, මඤ්ජූසා සුලසා දිසා
නාසා ජුණ්හා ගුහා ඊහා, ලසිකා වසුධා ඛුධා.

ඉ'ච්චාදයො කඤ්ඤා සද්දසමා.

වලවා, වෙළඹය; අලම්බුසා, එනම් දෙවඟනය; මූසා, කෝවය; මඤ්ජූසා, කරඬුවය; සුලසා, තලාගසය; දිසා, දිගය; නාසා, නාසිකාවය; ජුණ්හා, සඳරැස්ය; ගුහා, ලෙනය; ඊහා, විතකීකය, ලසිකා. සඳමිදුලුය; වසුධා. පෘථිවිය; ඛුධා, ක්ෂුධාවය—

ඉති ආදයො, මේආදී ශබ්දයෝ; කඤ්ඤා සද්දසමා, කඤ්ඤා ශබ්දයහා සමයි—

පත්ති යුත්ති වුත්ති කිත්ති, මුත්ති තිත්ති ඛන්ති කන්ති
සන්ති තන්ති සිද්ධි සුද්ධි, ඉද්ධි වුද්ධි බුද්ධි බොධි.

පත්ති. පාබල සෙනඟය; යුත්ති, න්‍යායය; වුත්ති, සූත්‍ර විවරණය හෝ පැවැත්මය; කිත්ති. ගුණ ඝොෂාවය; මුත්ති, මිදීමය; තිත්ති, තෘප්තිය; ඛන්ති, ඉවසීමය; කන්ති, දීප්තිය; සන්ති, සංහිඳීමය; තන්ති, පාලිය; සිද්ධි. නිපදවීමය; සුද්ධි, පිරිසිදුය; ඉද්ධි; සෘද්ධිය; වුද්ධි, වැඩීමය; බුද්ධි, ප්‍රඥවය; බොධි, චතුස්සත්‍යාවබොධය—

භූමි ජානි පීති යූනි, තණ්හා සන්ධි සානි කොටි
දිට්ඨි වුට්ඨි තුට්ඨි යට්ඨි, පාළි ආලි නාළි කෙළි.

භූමි, පොළොවය; ජාති. ඉපදීමය; පීති, ප්‍රීතිය; යූති, වැදීමය තණ්හා, රාගය හෝ සතුටය; සන්ධි, සන්ධිය; සානි, තිරය; කොටි, කෙළය නොහොත් කොණය; දිට්ඨි, දෘෂ්ටිය; වුට්ඨි, වර්ෂාවය; තුට්ඨි, සතුටය; යට්ඨි, යටලිය; පාළි, පෙළය; ආලි, මියරය; ගෙවත් වැව් බැම්මය; නාළි, නැළිය හෝ කුඹලය; කෙළි, ක්‍රීඩාවය;

සති මති ගති චුති ඨිති රති රුචි ජිවි යුවති කන්ති රංසි අසනි වසනි ඔසධි අඞ්ගුලි ධූලි දුන්දුභි දෙණි අටවි පාටලි සිරි දූති ආකති——ඉච්චා'දයො රත්ති'ව.

සති, සිහිය; මති, ප්‍රඥාවය; ගති, ගමනය; චුති, චුතවීමය; ඨිති, විර්‍ය්‍යය; රති, ආලය; රුචි, කැමැත්තය; ජිවි, සීවිය; යුවති, තරුණස්ත්‍රිය' කන්ති, කිරීමය; රංසි, රශ්මිය හෝ රැහැනය; අසනි, හෙනය; වසනි වස්ත්‍රය; ඔසධි, එනම් තාරකාවය; අඞ්ගුලි, ඇඟිල්ලය; ධූලි, රජස්ය; දුන්දුභි, බෙරය; දෙණි, ඔරුවය; අටවි, වනය; පාටලි, පළොල්ය; සිරි, ඓශ්වර්‍ය්‍යහෝ ශ්‍රීය; දූති, සතුතිය; ආකති, ආකාරය (සමානය);—ඉති ආදයො, මේආදී (ශබ්ද දයෝ); රත්තිඉව, රත්ති ශබ්දයා මෙනි-

මහී වෙතරණී වාපී, පාටලී කදලී ඝටී
නාරී කුමාරී තරුණී, වාරුණී බ්‍රාහ්මණීසඛී.

මහී, පොළොවය; වෙතරණී, එනම් ඔසුපත් නිරය; වාපී, වැවය; පාටලි, පළොල්ය; කදලි, කෙසෙල්ය; ඝටී, කළය; නාරී, නරස්ත්‍රිය; කුමාරී, කුමරිය; තරුණී, තරුණස්ත්‍රිය; වාරුණී, වරුණභාර්‍ය්‍යාවය; බ්‍රාහ්මණී, බැමිණිය; සඛී. යෙහෙළිය-

ගන්ධබ්බී කින්නරී නාගී, දෙවී යක්ඛී අජී මිගී
වානරී සූකරී සීහී, හංසී කාකීච කුක්කුටී.

ඉච්චා'දයො නදී'ව.

ගන්ධබ්බී, ගන්ධර්වස්ත්‍රිය; කින්නරී, කිඳුරිය; නාගී, නාගමානවිකාය; දෙවී, රාජස්ත්‍රිය; යක්ඛී, යකින්නය; අජී, එළුදෙනය; මිගී. මුවදෙනය; වානරී, වැඳිරිය; සූකරී, ඊරිය; සීහී, සිංහධෙනුවය; හංසී, හංසධෙනුවය; කාකී, කැව්ඩිය; කුක්කුටී, කිකිළිය; ඉති ආදයො, මේආදී ශබ්දයෝ; නදී ඉව, නදී ශබ්දයාමෙනි.

එවං ධාතු ධෙනු කාසු දද්දු කණ්ඩු කච්ඡු රජ්ජු කනෙරු පියඞ්ගු ආදිසද්දා'පි—යාගුසද්දො'ච.

ධාතු, (පඤ්චධාතු ආදි) ධාතුය; ධෙනු, දෙනය; කාසු, වළය; දද්දු, දදය; කණ්ඩු, කණ්ඩුතිය; කච්ඡු, කස්ය හෙවත් කැසීමය; රජ්ජු, රැහැණය; කනෙරු, ඇනින්නය; පියඞ්ගු, පුවඟුව; ආදී, මේආදිවූ; සද්දාපි, ශබ්දයෝද; යාගුසද්දොච, යාගුශබ්දයා මෙනි.

කඤ්ඤා රත්ති නදී යාගු, මාතු ධීතු දුහිතු'පි
ජම්බු අජාදි නගරාදී, මාතුලානි සඛාදිච.
භොතී මාන විතක්කදී, ගුණවති මඝනීතිච
ගහපතානීච මෙධාවී, ධම්මචාරි'ත්ථි සඞ්ගහො.

කඤ්ඤා, කඤ්ඤා ශබ්දයද; රත්ති, රත්ති ශබ්දයද; නදී, නදී ශබ්දයද; යාගු, යාගු ශබ්දයද; මාතු, මාතු ශබ්දයද; ධීතු, ධීතු ශබ්දයද; දුහිතු අපි, දුහිතු ශබ්දයද; ජම්බු, ජම්බු ශබ්දයද; අජ දී, අජ ආදි ශබ්දයෝද; නගරාදී, නගරී ශබ්දය ආදී ශබ්දයෝද; මාතුලානී, මාතුලානී ශබ්දයද; සඛාදිච, සඛීආදී ශබ්දයෝද; භොති, භොති ශබ්දයද; මානවී ඉති, මානවියත; ආදී, මේ ආදී ශබ්දයෝද; ගුණවති, ගුණවතී ශබ්දයද; මඝනී ඉතිච, මඝනී යන ශබ්දයද; ගහපතානීච, ගහපතානී ශබ්දයද; මෙධාවී, මෙධාවී ශබ්දයද; ධම්මචාරී, ධම්මචාරී ශබ්දයද; ඉත්ථි, ස්ත්‍රීලිඞ්ගයෙහි; සඞ්ගහො, සංග්‍රහයි—

## ඉත්ථි ලිඞ්ගා.

පුඤ්ඤ පාප ඵල රූප සාධනං, සොත ඝාණ සුඛ දුක්ඛ කාරණං
දාන සීල ධන ඣාන ලොචනං, මූල කූල බල ජාල මඞ්ගලං.

පුඤ්ඤ, පුණ්‍යය; පාප, පාපය; ඵල, විපාකය; රූප, රූපය; සාධනං, සිද්ධිය; සොත, කර්ණය; ඝාණ, නාසය; සුඛ, සැපය; දුක්ඛ, දුකය; කාරණං, හේතුවය; දාන' දීමය; සීල, ස්වභාව හෝ සිල්ය; ධන, වස්තුවය; ඣාන, ධ්‍යානය; ලොචනං, ඇසය; මූල, මුලහෝ මිලය; කූල, ඉවුරය; බල, ශක්තිය; ජාල, දැලය; මඞ්ගලං, මඞ්ගලය—

නලිනලිඞ්ග මුඛ'ඞ්ගජලම්බුජං, පුලිනධඤ්ඤ හිරඤ්ඤපද'මතං
පදුම පණ්ණ සුසාන වනා'යුධං, හදය චීවර වත්ථ කුලි'න්ද්‍රියං

නලින, පියුමය; ලිඞ්ග, පුරුෂ නිමිතිආදී නිමිත්ත හෝ ලක්‍ෂණය; මුඛ, මුහුණය; අඞ්ග, අවයවය; ජල, වතුරය; අම්බුජං, පියුමය; පුලින, වැලිය; ධඤ්ඤ, * සප්තවිධ ධාන්‍යය; හිරඤ්ඤ, අමුරන්ල; පද, අක්‍ෂර බබුලුවන වර්ණයෝය; අමතං, නිර්වාණය හෝ දිවබොජ්ජනය; පදුම, පියුමය; පණ්ණ, පත්‍රය; සුසාන, සොහොනය; වන, කැලය; ආයුධං, ආයුධය; හදය, හෘදය; චීවර, සිවිරය; වත්ථ, වස්ත්‍රය; කුල, වංශය; ඉන්ද්‍රියං, ඉන්ද්‍රියය—

නයන වදන යානො'දන සොපාන පාණං
භවන'භුවන ලොහා 'ලාත තුණ්ඩ'ණ්ඩ පීඨං
කරණ මරණ ඤාණ 'රම්මණ 'රඤ්ඤ තානං
නගර නාගර තීර'ච්ඡත්ත ඡිද්දු'දකානි.

ඉච්චා'දයො චිත්ත සද්දසමා.

නයන, ඇසය; වදන, මුහුණය; යාන, යානාවය; උදන, ප්‍රීති වාක්‍යය; සොපාන, හිනය; පාණං, පැන්ය; භවන, රාජ භවනාදිය; භුවන, ලොකය; ලොහ, ලොහජාතිය; අලාත, පෙනහෙලිය; තුණ්ඩ, තුඩය; අණ්ඩ, බීජය; පීඨං, පුටුවය; කරණ, කිරීම හෝ කරන්නාය; මරණ, මරණය; ඤාණ, නුවනය; ආරම්මණ, අරමුණය; අරඤ්ඤ, වනය; තානං, රක්‍ෂාස්ථානය; හෙවත් නිවණය; නගර, නුවරය; නාගර, නුවරය; තීර, තෙරය; ඡත්ත, කුඩය; ඡිද්ද, සිදුරය; උදකානි, ජලය යන මොහුය;—ඉති ආදයෝ, මේ ආදී(ශබ්දයෝ)චිත්තසද්දසමා, චිත්ත ශබ්දයහා සමයෝයි—

මනං සිරං උරං තෙජං, රජං ඔජං වයං පයං
යසං තපං වචං චෙතං, එවමා'දි මනො ගණෙ.

මනං, මනසය; සිරං, හිසය; උරං, ළයය; තෙජං, තෙදය; රජං, රජස්ය; ඔජං, ඕජවය; වයං, වයසය; පයං, ජලය හෝ කිරිය; යසං, කීර්තිය; තපං, තපසය; වචං, වචනය; චෙතං, සිතිවිලිය, එවමාදී, මේආදීහු;මනොගණෙ, මනො ශබ්දාදීන්ට අයිතිවූ ශබ්දසමූහයයි—

මනො තමො තපො තෙජෝ, වචො ඔජෝ උරො සිරො
රජෝ යසො පයො චේතො, සරො වාසො වයො අයො,

---

* සාලි වීහි ච කුද්‍රූසො, ගොධූමො වරකො යවො
කඞ්ගු(ති සත්ත ධඤ්ඤානි)

මනො, සිතය; තමො, අන්‍ධකාරය; තපො, තපසය; තේජො, තෙදය; වචො, වචනය; ඔජො, ඔජසය; උරො, ළයය; සිරො, හිසය; රජො, රජස්ය; යසො, යසසය; පයො, කිරිය; චෙතො. සිතිවිලිය; සරො, විලය; වාසො, වස්ත්‍රය; වයො, වයසය; අයො, යකඩය—

ජලාසයෙ සරො හොති, අයො ලොහෙ 'යුනොබයෙ
වයොකෙඛයෙන පටෙ වාසො මනෙ චෙතො මනාදිසු.

ජලාසයෙ, ජලපිහිටි තන්හී හෙවත් විලෙහී වැටෙන්නාවූ; සරො, සර ශබ්දයතෙම; මනාදිසු, මන ශබ්දාදීන් කෙරෙහි; හොති, වේ; (මෙයින් ස්වරාදි වාචක සර ශබ්දය මන ශබ්දාදි යට හෙවත් මනොගණයට ඇතුලත් නොවන බව කියත්)—

විලවාචක තැන තෘතියා, පඤ්චමි එකවචන යෙහි; "සරසා" චතුර්ත්ථිෂෂ්ඨී; "සරසො" සප්තමී; "සරසි" ස්වරපදම වාචක තැන; "සරෙන, සරම්හා; සරා, සරෙ" කියාවේ;-ලොහෙ, ලොහයෙහි හෙවත් යකඩෙහි වැටෙන්නාවූ; අයො, අය ශබ්දය තෙම; (මනොගණයෙහි වේ; සුඛාදිවාචකතැන නොවේ:) ආයුනො ඛයෙ, ආයුසයාගේ ක්‍ෂයවීමෙහි හෙවත් වයසයෙහිවූ; වයො, වය ශබ්දයතෙම; ඓදයෙන, (මනො ගණයෙහි) දතයුත්තේය; (මෙයින් වෘයෙහි වැටෙන කල මනොගණයෙහි නොවෙයි කියත්) පටෙ, වස්ත්‍රයෙහි වැටෙන්නාවූ; වාසො, වාසශබ්දය; (මනොගණයෙහිදතයුතුයි)(මෙයින් වාසයකිරීම්ආදියෙහිවන කල මනොගණයෙහි නොවෙයි කියත්)මනෙ, සිත්හී වැටෙන් නාවූ; චෙතො, චෙත ශබ්දය; මනාදිසු, මන ශබ්දාදීන් කෙරෙ හි වේ; (මෙයින් චෙතාපනයෙහි වැටෙනකලැ මනො ගණ යෙහි නොවෙයි කියත්)

මෙහි සරො යනාදිය මනොගණ යෙහිවූ ශබ්දයන් සංස්කෘ ත භාෂාවෙහි සකාරාන්ත "මනස්" ශබ්දාදිය හෙයින් "මනඃ" යනාදීන් ප්‍රථමා එකවචනයෙහි වනසේ. පාලියෙහිද නපුංසක ලිඞ්ග ප්‍රථමා එක වචනයෙහි වන රූපයන්—පුල්ලිඞ්ගික යයි නොගතයුතුයි—විභක්ති ලොපයෙහිද මනොගණ ශබ්දයන් කෙරෙන් ඔකාරාගමයි "මනො මයං-අයො මයං" යනාදීන් දතයුතුයි—

එවං සත්‍ති දධි වාරි අක්‍ඛි අච්ඡි අච්චි ඉච්චාදයො අට්ඨි සද්දසමා.

සත්‍ති, කාලවය; දධි. දිය; වාරි, ජලය; අක්‍ඛි, ඇසය; අච්ඡි, ඇසය; අච්චි, ගිනිසිලය; ඉති, මෙසේ; එවං ආදයො, මේආදි (ශබ්දයෝ) අට්ඨිසද්දසමා, අට්ඨි ශබ්දයහා සමයි.

එවං චක්‍ඛු වසු ධනු දරු තිපු මධු සිගාලු භිඩ්ඩු වත්‍ථු මත්‍ථු ජතු අම්බු අස්සු ආදයො ආයුසද්ද සමා.—

චක්‍ඛු, ඇස; වසු, ධනය; ධනු, දුන්නය; දරු, කාෂ්ඨය; තිපු, ඊයම්; මධු, මීය; සිගාලු මුරුංගාය, හිංගු; පෙරුම්කායම්ය; වත්‍ථු, පුන්‍යක්‍රියා වස්තුය; මත්‍ථු, දිපෙරලිදිය; ජතු, ලාකඩය; අම්බු, ජලය; අස්සු, කඳුලුය; ආදයො, මේආදි ශබ්දයෝ; එවං, මෙසේම; ආයු සද්දසමා, ආයු ශබ්දය සමානයෝයි—

චිත්තං මනාදි ගුණවා- ගච්ඡං අට්ඨිච දණ්ඩිච
ආයු ඉ'ච්චෙව සංඛෙපා- සද්ද'නෙත්‍ථ නපුංසකෙ.

චිත්තං, චිත්ත ශබ්දය; මනාදි, මන ශබ්දය ආදි ශබ්දයෝද; ගුණවා, ගුණවන්තු ශබ්දය; ගච්ඡං, ගච්ඡන්ත ශබ්දය අට්ඨි(ච) අට්ඨි ශබ්දය; දණ්ඩි(ච)දණ්ඩි ශබ්දය; ආයුඉති, ආයු ශබ්දයද යන; සංඛෙපා සද්දනි, සංක්‍ෂෙප ශබ්දයෝ; එත්‍ථ, මෙහි; එවං, මෙසේ; නපුංසකෙ, නපුංසක ලිඟුයෙහි; (සංග්‍රහයි)

නපුංසකලිඞ්ගා.

නමො බුද්ධාය.

වත්තමානා-ති අන්ති සි ථ මි ම-තෙ අන්තෙ සෙ ව්හෙ එ ම්හෙ-
වත්තමානා පච්චුප්පන්නෙ.

කත්තරි පරස්ස පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | පචති |
| | බ | තෙ | ,, | පචන්ති. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ,, | පචසි. |
| | බ | තුම්හෙ | ,, | පචථ. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | පචාමි. |
| | බ | මයං | ,, | පචාම. |

කත්තරි අත්තනොපදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | පචතෙ. |
| | බ | තෙ | ,, | පචන්තෙ. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ,, | පචසෙ. |
| | බ | තුම්හෙ | ,, | පචව්හෙ. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | පචෙ. |
| | බ | මයං | ,, | පචාම්හෙ |

කම්මනි අත්තනො පදෙ.

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තයා මයා වා | සො(ඔදනො) | පච්චතෙ. |
| | බ | ,, | තෙ | පච්චන්තෙ. |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්වං | පච්චසෙ. |
| | බ | ,, | තුම්හෙ | පච්චව්හෙ. |
| උත්තමපුරිසො | එ | ,, | අහං | පච්චෙ. |
| | බ | ,, | මයං | පච්චාම්හෙ. |

කම්මනි පරස්ස පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තයා මයා වා | සො(ඔදනො) | පච්චති. |
| | බ | ,, | තෙ | පච්චන්ති. |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්වං | පච්චසි. |
| | බ | ,, | තුම්හෙ | පච්චථ. |
| උත්තමපුරිසො | එ | ,, | අහං | පච්චාමි. |
| | බ | ,, | මයං | පච්චාම. |

භාවෙ- භූයති භූයතෙ ඉච්චාදි,

තෙන සො ඔදනො පච්චති තෙ ඔදනා පච්චන්ති ත්වං ඔදන පච්චසි තුම්හෙ ඔදනා පච්චථ අහං ඔදනො පච්චාමි මයං ඔදනා පච්චාම ඉති ඔදන සද්දං සබ්බත්ථාපි යොජෙතබ්බා—

පඤ්චමී-තු අන්තු හි ථ මි ම තං අන්තං ස්සු වෝහ ඒ ආමසෙ.

ආණත්‍යාසිට්ඨෙ නුත්ත කාලෙ පඤ්චමී *

කත්තරි පරස්ස පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | පචතු. |
| | බ | තෙ | ,, | පචන්තු. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ,, | පච, පචාහි. |
| | බ | තුම්හෙ | ,, | පචථ. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | පචාමි. |
| | බ | මයං | ,, | පචාම. |

කත්තරි අත්තනො පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | පචතං. |
| | බ | තෙ | ,, | පචන්තං. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ,, | පචස්සු. |
| | බ | තුම්හෙ | ,, | පචව්හො. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | පචෙ. |
| | බ | මයං | ,, | පචාමසෙ. |

කම්මනි අත්තනො පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තයා මයා වා | සො (ඔදනො) | පච්චතං. |
| | බ | ,, | තෙ | පච්චන්තං. |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්වං | පච්චස්සු |
| | බ | ,, | තුම්හෙ | පච්චව්හො. |
| උත්තමපුරිසො | එ | ,, | අහං | පච්චෙ. |
| | බ | ,, | මයං | පච්චාමසෙ. |

කම්මනි පරස්ස පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තයා මයා වා | සො (ඔදනො) | පච්චතු, |
| | බ | ,, | තෙ | පච්චන්තු. |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්වං | පච්ච පච්චාහි. |
| | බ | ,, | තුම්හෙ | පච්චථ. |
| උත්තම පුරිසො | එ | ,, | අහං | පච්චාමි. |
| | බ | ,, | මයං | පච්චාම. |

භාවෙ-භූයතු භූයතං.

---

* අනාගතානන්තාත්‍යත්ථෙ ආසිංසනෙච-“පච්ඡසතු” ඉච්චාදිනා නයෙන අඤ්ඤානිපි විභත්ති ඉච්ඡිතබ්බා—

සත්තමී-එය්‍ය එය්‍යුං එය්‍යාසි එය්‍යාථ එය්‍යාමි එය්‍යාම-
එථ එරං එථො එය්‍යාවෙහො එය්‍යං එය්‍යාමෙහෙ.

අනුමති පරිකප්පනෙසු සත්තමී.

කත්තරි පරස්ස පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | පචෙ පචෙය්‍ය. |
| | බ | තෙ | ,, | පචෙය්‍යුං. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ,, | පචෙය්‍යාසි. |
| | බ | තුම්හෙ | ,, | පචෙය්‍යාථ. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | පචෙය්‍යාමි. |
| | බ | මයං | ,, | පචෙය්‍යාම. |

කත්තරි අත්තනො පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | පචෙථ. |
| | බ | තෙ | ,, | පචෙරං. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ,, | පචෙථො. |
| | බ | තුම්හෙ | ,, | පචෙය්‍යාවෙහො. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | පචෙය්‍යං. |
| | බ | මයං | ,, | පචෙය්‍යාමෙහෙ. |

කම්මනි අත්තනො පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තයා මයා වා | සො (ඔදනො) | පච්චෙථ, |
| | බ | ,, | තෙ | පච්චෙරං.. |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්වං | පච්චෙථො |
| | බ | ,, | තුම්හෙ | පච්චෙය්‍යාවෙහො. |
| උත්තමපුරිසො | එ | ,, | අහං | පච්චෙය්‍යං. |
| | බ | ,, | මයං | පච්චෙය්‍යාමෙහෙ |

කම්මනි පරස්ස පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තයා මයා වා | සො (ඔදනො) | පච්චෙ පච්චෙය්‍ය. |
| | බ | ,, | තෙ | පච්චෙය්‍යුං. |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්වං | පච්චෙය්‍යාසි. |
| | බ | ,, | තුම්හෙ | පච්චෙය්‍යාථ. |
| උත්තමපුරිසො | එ | ,, | අහං | පච්චෙය්‍යාමි. |
| | බ | ,, | මයං | පච්චෙය්‍යාම. |

භාවෙ-භූයෙ භූයෙය්‍ය භූයෙථ ඉච්චාදී

පරොක්ඛා-අ උ එ ත්ථ අ ම්හ—ත්ථ රෙ ත්ථො ව්හො ඉ ම්හෙ.

අපච්චක්ඛෙ පරොක්ඛා තීතෙ.

කත්තරි පරස්ස පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | පපච. |
| | බ | තෙ | ,, | පපචු. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ,, | පපචෙ. |
| | බ | තුම්හෙ | ,, | පපචිත්ථ. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | පපච. |
| | බ | මයං | ,, | පපචිම්හ. |

කත්තරි අත්තනො පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | පපචිත්ථ. |
| | බ | තෙ | ,, | පපචිරෙ. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ,, | පපචිත්ථො. |
| | බ | තුම්හෙ | ,, | පපචිව්හො. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | පපචි. |
| | බ | මයං | ,, | පපචිම්හෙ. |

කම්මනි අත්තනො පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තා යාමයාවා | සො(ඔදනො) | පපච්චිත්ථ. |
| | බ | ,, | තෙ | පපච්චිරෙ. |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්වං | පපච්චිත්ථො. |
| | බ | ,, | තුම්හෙ | පපච්චිව්හො. |
| උත්තමපුරිසො | එ | ,, | අහං | පපච්චි. |
| | බ | ,, | මයං | පපච්චිම්හෙ. |

කම්මනි පරස්ස පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තා යාමයාවා | සො(ඔදනො) | පපච්ච. |
| | බ | ,, | තෙ | පපච්චු. |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්වං | පපච්චෙ. |
| | බ | ,, | තුම්හෙ | පපච්චිත්ථ. |
| උත්තමපුරිසො | එ | ,, | අහං | පපච්ච. |
| | බ | ,, | මයං | පපච්චිම්හ. |

භාවෙ-හුය හුයිත්ථ බභුය බභුයිත්ථ ඉච්චාදි.

ඍියතත්‍තනි-ආ ඌ ඕ ත්‍ථ අ ම්හා-ත්‍ථ ත්‍ථුං සෙ වහං ඉං මිහසෙ.

ඍියොපපභූති පච්චක්ඛෙවා අපච්චක්ඛෙවා අතීතෙ කාලෙ ඍියතත්‍තනි

කත්තරි පරස්ස පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | අපචා. |
| | බ | තෙ | ,, | අපචූ. |
| මජ්ඣිමපුරිසො | එ | ත්‍වං | ,, | අපචො |
| | බ | තුම්හෙ | ,, | අපචත්‍ථ. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | අපච, |
| | බ | මයං | ,, | අපච ම්හා. |

කත්තරි අත්තනො පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | අපචත්‍ථ. |
| | බ | තෙ | ,, | අපචත්‍ථුං. |
| මජ්ඣිමපුරිසො | එ | ත්‍වං | ,, | අපචසෙ. |
| | බ | තුම්හෙ | ,, | අපචවහං. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | අපචිං. |
| | බ | මයං | ,, | අපචාම්හසෙ. |

කම්මනි අත්තනො පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තා යාමයාවා | සො(ඔදනො) | අපච්චත්‍ථ. |
| | බ | ,, | තෙ | අපච්චත්‍ථුං. |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්‍වං | අපච්චසෙ. |
| | බ | ,, | තුම්හෙ | අපච්චවහං. |
| උත්තමපුරිසො | එ | ,, | අහං | අපච්චිං. |
| | බ | ,, | මයං | අපච්චාම්හසෙ. |

කම්මනි පරස්ස පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තා යාමයාවා | සො(ඔදනො) | අපච්චා. |
| | බ | ,, | තෙ | අපච්චු. |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්‍වං | අපච්චො. |
| | බ | ,, | තුම්හෙ | අපච්චත්‍ථ. |
| උත්තමපුරිසො | එ | ,, | අහං | අපච්ච. |
| | බ | ,, | මයං | අපච්ච ම්හා. |

භාවෙ-අභූයත්‍ථ භූයත්‍ථ අභූයා භූයා ඉච්චාදි—

අජ්ජතනී-ඊ උං ඔ ත්ථ ඉං ම්හා ආ ඌ සෙ ව්හං අ ම්හෙ.

අජ්ජප්පභුති සමීපෙ අතීතෙ කාලෙ අජ්ජතනී

කත්තරි පරස්ස-පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | අපචිපචි අපචීපචී. |
| | බ | තෙ | ,, | * අපචිංසු අපචුං. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ,, | අපචො. |
| | බ | තුම්හෙ | ,, | අපචිත්ථ. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | අපචිං. |
| | බ | මයං | ,, | අපචිම්හා |

කත්තරි අත්තනො පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | අපචා. |
| | බ | තෙ | ,, | අපචූ. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ,, | අපචිසෙ. |
| | බ | තුම්හෙ | ,, | අපචිව්හං. |
| උත්තමපුරිසො | එ | අහං | ,, | අපච. |
| | බ | මයං | ,, | අපචිම්හෙ |

කම්මනි අත්තනො පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තයා මයා වා | සො(ඔදනො) | අපච්චා |
| | බ | ,, | තෙ | අපච්චූ. |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්වං | අපච්චසෙ, |
| | බ | ,, | තුම්හෙ | අපච්චව්හං |
| උත්තමපුරිසො | එ | ,, | අහං | අපච්ච. |
| | බ | ,, | මයං | අපච්චිම්හෙ. |

කම්මනි පරස්ස පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන තයා මයා වා | සො(ඔදනො) | අපච්චී අපච්චි |
| | බ | ,, | තෙ | අපච්චිංසු අපච්චුං |
| මජ්ඣිමපුරිසො | එ | ,, | ත්වං | අපච්චො. |
| | බ | ,, | තුම්හෙ | අපච්චිත්ථ. |
| උත්තමපුරිසො | එ | ,, | අහං | අපච්චිං, |
| | බ | ,, | මයං | අපච්චිම්හා. |

භාවෙ-අභූයී භූයී අභූයා භූයා ඉච්චාදී.

---

* අකාරාගමාභාවෙ "පචිංසු පචුං" ඉච්චාදීනි රූපානි හොන්ති-

භවිස්සන්ති-ස්සති ස්සන්ති ස්සසි ස්සථ ස්සාමි ස්සාම ස්සතෙ ස්සන්තෙ ස්සසෙ ස්සවෙහ ස්සං ස්සාමෙහ.

### අනාගතෙ භවිස්සන්ති.

කත්තරි පරස්ස පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | පචිස්සති, |
| | බ | තෙ | „ | පචිස්සන්ති, |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | „ | පචිස්සසි. |
| | බ | තුම්හෙ | „ | පචිස්සථ.. |
| උත්තමපුරිසො | එ | අහං | „ | පචිස්සාමි. |
| | බ | මයං | „ | පචිස්සාම. |

කත්තරි අත්තනො පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | පචිස්සතෙ. |
| | බ | තෙ | „ | පචිස්සන්තෙ. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | „ | පචිස්සසෙ. |
| | බ | තුම්හෙ | „ | පචිස්සවෙහ. |
| උත්තමපුරිසො | එ | අහං | „ | පචිස්සං. |
| | බ | මයං. | „ | පචිස්සාමෙහ. |

කම්මනි අත්තනො පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන ත<br>යාමයාවා | සො(ඔදනො) | පච්චිස්සතෙ. |
| | බ | „ | තෙ | පච්චිස්සන්තෙ. |
| මජ්ඣිමපුරිසො | එ | „ | ත්වං. | පච්චිස්සසෙ. |
| | බ | „ | තුම්හෙ | පච්චිස්සවෙහ. |
| උත්තමපුරිසො | එ | „ | අහං | පච්චිස්සං. |
| | බ | „ | මයං | පච්චිස්සාමෙහ. |

කම්මනි පරස්ස පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | තෙන ත<br>යාමයාවා | සො(ඔදනො) | පච්චිස්සති. |
| | බ | „ | තෙ | පච්චිස්සන්ති. |
| මජ්ඣිමපුරිසො | එ | „ | ත්වං | පච්චිස්සසි. |
| | බ | „ | තුම්හෙ | පච්චිස්සථ. |
| උත්තමපුරිසො | එ | „ | අහං | පච්චිස්සාමි. |
| | බ | „ | මයං | පච්චිස්සාම. |

භූ:ගෙව-භූයිස්සති භූයිස්සතෙ ඉච්චාදී.

කාලාතිපත්ති-ස්සා ස්සංසු ස්සෙ ස්සථ ස්සං ස්සාම්හා ස්සථ ස්සිංසු ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හසෙ.

## ක්‍රියාතිපන්නෙ අතීතෙ කාලාතිපත්ති.

### කත්තරි පරස්ස පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | අපචිස්සා. |
| | බ | තෙ | ” | අපචිස්සංසු. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ” | අපචිස්සෙ. |
| | බ | තුම්හෙ | ” | අපචිස්සථ. |
| උත්තමපුරිසො | එ | අහං | ” | අපචිස්සං. |
| | බ | මයං | ” | අපචිස්සාම්හා. |

### කත්තරි අත්තනො පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | සො | ඔදනං | අපචිස්සථ. |
| | බ | තෙ | ” | අපචිස්සිංසු. |
| මජ්ඣිමපුරිසො | එ | ත්වං | ” | අපචිස්සසෙ. |
| | බ | තුම්හෙ | ” | අපචිස්සව්හෙ. |
| උත්තමපුරිසො | එ | අහං | ” | අපචිස්සං. |
| | බ | මයං | ” | අපචිස්සාම්හසෙ. |

### කම්මනි අත්තනො පදෙ

| | | කත්තා | කම්මං | ක්‍රියා |
|---|---|---|---|---|
| පඨමපුරිසො | එ | {තෙන තා යාමයාවා} | සො(ඔදනො) | අපච්චිස්සථ. |
| | බ | ” | තෙ | අපච්චිස්සිංසු. |
| මජ්ඣිමපුරිසො | එ | ” | ත්වං | අපච්චිස්සසෙ. |
| | බ | ” | තුම්හෙ | අපච්චිස්සව්හෙ. |
| උත්තමපුරිසො | එ | ” | අහං | අපච්චිස්සං. |
| | බ | ” | මයං | අපච්චිස්සාම්හසෙ. |

### කම්මනි පරස්ස පදෙ

| | | | | |
|---|---|---|---|---|
| පඨම පුරිසො | එ | {තෙන තා යාමයාවා} | සො(ඔදනො) | අපච්චිස්සා. |
| | බ | ” | තෙ | අපච්චිස්සිංසු. |
| මජ්ඣිමපුරිසො | එ | ” | ත්වං | අපච්චිස්සෙ. |
| | බ | ” | තුම්හෙ | අපච්චිස්සථ. |
| උත්තමපුරිසො | එ | ” | අහං | අපච්චිස්සං. |
| | බ | ” | මයං | අපච්චිස්සාම්හා. |

භාවෙ-අභූයිස්සා අභූයිස්සථ ඉච්චාදි.

## වත්තමානෙ හෙත්වත්ථෙ

ධාතූහි ණෙ ණය ණාපෙ ණාපයා කාරිතානි හෙත්වත්ථෙ.

| | කත්තරි පරස්සපදෙ. | | කත්තරි අත්තනොපදෙ. | |
|---|---|---|---|---|
| | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| ණෙ | පාචෙති | පාචෙන්ති | පාචෙතෙ | පාචෙන්තෙ |
| | පාචෙසි | පාචෙථ | පාචෙසෙ | පාචයව්හෙ |
| | පාචෙමි | පාචෙම | පාචෙ | පාචෙම්හෙ |
| ණය | පාචයති | පාචයන්ති | පාචයතෙ | පාචයන්තෙ |
| | පාචයසි | පාචයථ | පාචයසෙ | පාචයව්හෙ |
| | පාචයාමි | පාචයාම | පාචයෙ | පාචයම්හෙ |
| ණාපෙ | පාචාපෙති | පාචාපෙන්ති | පාචාපෙතෙ | පාචාපෙන්තෙ |
| | පාචා පෙසි | පාචාපෙථ | පාචාපෙසෙ | පාචාපෙව්හෙ |
| | පාචාපෙමි | පාචාපෙම | පාචාපෙ | පාචාපෙම්හෙ |
| ණාපය | පාචාපයති | පාචාපයන්ති | පාචාපයතෙ | පාචාපයන්තෙ |
| | පාචාපයසි | පාචාපයථ | පාචාපයසෙ | පාචාපයව්හෙ |
| | පාචාපයාමි | පාචාපයාම | පාචාපයෙ | පචාපයම්හෙ |

අට්ඨ විභත්තීසු ඤෙය්‍යං

ගණ භෙදෙ,

පචති පචන්ති ත්‍යාදි — භූවාදි.
රුන්ධති රුන්ධන්තීත්‍යාදි — රුධාදි.
දිබ්බති දිබ්බන්ති ත්‍යාදි — දිවාදි.
සුණොති සුණන්තීත්‍යාදි — ස්වාදි.
කිණාති කිණන්තීත්‍යාදි — කියාදි
ගණ්හාති ගණ්හන්තීත්‍යාදි — ගහාදි,
කරොති කරොන්තීත්‍යාදි — තනාදි.
චොරෙති චොරෙන්තීත්‍යාදි — චුරාදි

නිට්ඨිතා ආඛ්‍යාතපදමාලා.

නමො තස්ස

භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

ආඛ්‍යාත දුක්ඛ කසිරුබ්භව මොක්ඛ මග්ගං
නත්වා තිලොකතිලකං මුනිරාජ සෙට්ඨං,
ආඛ්‍යාතිකා නාම'ධුනා කමතො පදානං
ව්‍යාඛ්‍යා කරීයති සුබොධන කාරිණී'යං.

## ආඛ්‍යාත ව්‍යාඛ්‍යා.

"යන්තිකාලං තිපුරිසං ක්‍රියාවාචි තිකාරකං,
අතිලිඞ්ගං ද්විවචනං තද'ඛ්‍යාතන්ති වුච්චති"

යං, යමක්තෙම; තිකාලං, තුන්කාලයක් ඇත්තේද; (අතීත අනාගත වර්තමාන යන තුන්කාලයයි) තිපුරිසං, පුරුෂතුනක් ඇත්තේද; (ප්‍රථම මධ්‍යම උත්තම යන පුරුෂතුනයි) ක්‍රියාවාචි, ක්‍රියා වාචකද, හෙවත් ගමන් පියීම් සිටීම් ආදී ක්‍රියාකියන සව භාව ඇත්තේද; තිකාරකං, කාරකතුනක් ඇත්තේද; (කර්තෘ කර්ම භාව යන කාරකතුනයි) අතිලිඞ්ගං, තුන්ලිඞ්ගය නැත්තේද; (ස්ත්‍රී පුරුෂ නපුංසක යන ලිඞ්ගත්‍රයයි) ද්විවචනං, වචන දෙකක් ඇත්තේද; (ඒකවචන බහුවචන යන වචන දෙකයි) තං, ඒ; ආඛ්‍යාතංඉති, ආඛ්‍යාතයයි; වුච්චති, කියනු ලැබේ—

"ආ"යන උපසර්ග පූර්වවූ"ඛ්‍යා"ප්‍රකථනෙ යන ධාතුහු කෙරෙන් කර්මකාරකයෙහි තප්‍රත්‍යය වීමෙන් හෝ කර්තෘකාරකයෙහි ත ප්‍රත්‍යය වීමෙන් හෝ ආඛ්‍යාත ශබ්දය සිද්ධවේ- ප්‍රකාශ කරණ ලද්දේය කියන ලද්දේය යන අර්ථයෙන් ප්‍රකාශ කරණ ලද් දක්ද කියන ලද්දක්ද ආඛ්‍යාත නම්වේ- ක්‍රියාව ප්‍රකාශකරණ පද්කොට්ඨාසයද ආඛ්‍යාතනම්- මෙහි ක්‍රියාප්‍රකාශකරණ පද කොට්ඨාසය ආඛ්‍යාතයයි දතයුතු-. සංස්කෘත ව්‍යාකරණයෙහි "ආ පූර්ව ඛ්‍යා" යන ධාතුහුකෙරෙන් "ක්ත" ප්‍රත්‍යයෙන් සිද්ධයි.

"ක්‍රියා ප්‍රධානමා'ඛ්‍යාතම්" ක්‍රියාව ප්‍රධානකොට ඇත්තේ ආඛ්‍යාතනම් වෙයි යනු යාස්කමතයි.

සො ආගමා, ඌ ගියේය; යනාදිතන්හි පසුගියකාලයෙහි කළ ක්‍රියාව කියන හෙයින් අතීතක්‍රියානම් වේ- "සො ගමිස්සති" ඌ මතු යන්නේය යනාදිතන්හි මතු කරන්ට යෙදෙන ක්‍රියාව කියවෙන හෙයින් අනාගත ක්‍රියානම් වේ- "සො ගච්ඡති" ඌ යෙයි- යනාදි තන්හි මේකාලයෙහි කරණ ක්‍රියාව කියන හෙයින් වත්මාන ක්‍රියානම්වේ- මෙසේ ආඛ්‍යාතයට කාල තුනක් ඇතිවේ- "සොගච්ඡති" ඌ යෙයි යනාදි තන්හි උඹ මම යන දෙදෙනා ගෙන් වෙන්වූ අනිකෙක් කරණ ක්‍රියාව කියවෙන හෙයින් ඒ ප්‍රථම පුරුෂනම්වේ- "ත්වං ගච්ඡසි" තෝ ගමන් කෙරෙහි යනාදි තන්හි තුම්හශබ්දය සම්බන්ධක්‍රියාව යෙදෙන හෙයින් මධ්‍යම පුරුෂනම්වේ- "අහං ගච්ඡාමි" මමයෙමි යනාදිතන්හි තමන් සම්බන්ධව ක්‍රියාව පවත්නා හෙයින් උත්තම පුරුෂනම් වේ- "සො තෙ ත්වං තුම්හෙ මයං අම්හෙ" යන කර්තෘ නොයෙදූ කල්හිද පුරුෂයලෙස හැඟේ- ඒකෙසේද? පචති කීකල සො යන කර්තෘව හැඟේ මේආදි ක්‍රමයෙනි- "සූදො ඔදනං පචති" අරක්කැමිතෙම බතපිසෙයි. යනා ා න්හී ක්‍රියාව කර්තෘටභාරව පිහිටිබැවින් ක්‍රියාවෙන් කියවෙන්නේ කර්තෘ හෙයින් පචති යනු කර්තෘකාරකක්‍රියාවයි. "සූදෙන ඔදනො පච්චතෙ" බත අරක්කැමියා විසින් පිසනු ලැබෙයි යනතන්හි ක්‍රියාව කර්මයට භාරවූබැවින් ක්‍රියාව ලබන කර්මය එයින්කියවෙන හෙයින් "පච්චති" යනු කර්මකාරක ක්‍රියාවයි. "භූයතෙ භවතා" භවත්හුවිසින් වීමය නොහොත් පින්වත්හුගේ වීමය යනාදිතන්හි ක්‍රියාව කර්තෘවාච්‍යත් නොව කර්මයකුත් නොපිහිටා ක්‍රියාව වීම පමණක් වන හෙයින් "භූයතෙ" යනු භාවකාරක ක්‍රියාවයි- ක්‍රියාවක් පුරුෂයෙක් කරණකල්හි හෝ ස්ත්‍රියක් කරණකල්හි හෝ මේදෙකින්මුත් යමක් ක්‍රියාකරණ කල්හි හෝ ලිඞ්ගප්‍රභෙදයෙන් ක්‍රියාවේ වෙනසක් නොවනනිසා තුන්ලිඞ්ගය නැත්තේය- ක්‍රියාව එක් කෙනෙක් කරණ කල්හි "පචති" පිසේ යනාදි වසයෙන්ද බොහෝදෙනෙක් කරණ කල්හි පචන්ති යනාදින් වන විශෙෂයෙන් එකවචන බහුවචන දෙක ඇතිවේ.

සංස්කෘත භාෂාවෙහිනම් එකවචන ද්විවචන බහුවචන වසයෙන් වචන තුනක් වේ·

පුරුෂතුන යෙදෙන පරිදි.

"නාමෙන සහ සංයුතෙත්ථා පඨමො පුරිසො මතො,
මජ්ඣිමො තුම්හසද්දෙන අම්හසද්දෙන උත්තමො."

නාමෙන සහ, නාමයෙහා සමග; සංයුජ්ජන්තා, යෙදුනේ; පඨමො පුරිසො, ප්‍රථම පුරුෂයයි; මතො, දන්නාලදී; තුම්හ සද්දෙන, තුම්හශබ්දය සමග (යෙදුනේ;) මජ්ඣිමො, මධ්‍යම (පුරුෂ)යයි; අම්හසද්දෙන, අම්හශබ්දයසමග(යෙදුනේ;) උත්තමො, උත්තම (පුරුෂ)යයි.

මෙහි නාමයයනු "තුම්හ අම්හ" ශබ්දදෙකින් පිටත්වූ ත ශබ්දයෙන් වාච්‍යවන යමකි. තශබ්දය තුම්හශබ්දය අම්හශබ්දය යන තුන පිළිවෙළින් ප්‍රථම මධ්‍යම උත්තම පුරුෂතුන සමග යෙදෙත්—පශ්චිමදිග්භාග වාසී ව්‍යාකරණ පණ්ඩිතයෝ නාම ශබ්දයන්ගේම ත ශබ්ද තුම්හශබ්ද අම්හශබ්ද තුන පුරුෂ තුන යයි කියත්—ඔවුන්ගේ මතයෙහි අම්හශබ්දය ප්‍රථම පුරුෂය තුම්හ ශබ්දය ද්විතීය පුරුෂය තශබ්දය තෘතීය පුරුෂයයි නිශ්චිතයි.

"වත්තමානා ති අන්ති සි ථ මි ම තෙ අන්තෙ සෙ ව්හෙ එ ම්හෙ" යනසූත්‍රයෙන් ති අන්ති සි ථ මි ම තෙ අන්තෙ සෙ ව්හෙ එ ම්හෙ යනප්‍රත්‍යය දොළස වර්තමාන විභක්තියි-මේ ප්‍රත්‍යයන්ට විභක්ති යන නාමයවේ- "කාලාදි වසෙන ධාත්වත්ථං විභජන්තී ති විභත්තියො" කල් ආදිවසයෙන් ධාත්වර්ථය බෙදත් යන අර්ථයෙන් විභක්තිනම් වෙත්. "වත්තමානා පච්චුප්පන්නෙ" යන සූත්‍රයෙන් පවත්නා කාලයෙහි වර්තමාන විභක්තියවේ.

"කාලොති වෙත්ථ කිරියා"යි කියනලද හෙයින් මෙහිකාලය නම් ක්‍රියාවයි. පවත්නා ක්‍රියාව වර්තමාන කාලයයි දතයුතු.

"අථපුබ්බානි විභත්තීනං ඡ පරස්සපදානි" යනු සූත්‍රයි- අථ, ඉක්බිතෙත්තන් (තද්ධිතයට මත්තෙහි) විභත්තීනං (වර්තමානාදි) විභක්තීන්ගේ; පුබ්බානි, පූර්වවූ; ඡ, සය; පරස්සපදානි; පරස්මෛ පදනම්වෙත්; අන්‍යයට පදයයනඅර්ථයි- පරස්මෛ පදයෝ කර්තෘකාරක ක්‍රියාවෙහි ප්‍රධානවෙත් "පරානත්තනො පදානි" (විභක්තීන්ගේ)පරවූ හෙවත් අග කියවෙන්නාවූ පදයෝ ආත්මනෙපදනම් වෙත්. ආත්මනෙ පදයෝ කර්මකාරක ක්‍රියාවෙහි ප්‍රධානවෙත්. මාගධ භාෂාවෙහි මෙසේනුමුත් සංස්කෘත භාෂාවෙහි භූ යනාදි ධාතු පරස්මෛ පදියි. ඔවුන්කෙරෙන් ආත්මනෙ පද නොයෙදෙත්."එධ"යනාදි ධාතු ආත්මනෙපදියි.ඔවුන් කෙරෙන් පරස්මෛපදයෝ නොයෙදෙත්-"කෘ" යනාදි ධාතු උභය පදියි ඔවුන්කෙරෙන් විවිධ පදයෝම යෙදෙත්-කවිකල්පද්‍රුමාදී ධාතු පාඨවල ඒ ධාතූන්ගේ පද නියමකරණ ලදී.

පාණිනී ආදි ව්‍යාකරණවල නියමකරණ ලද ක්‍රමයෙන් පරස්මෛපදාදීන්ගේ නියමය සංස්කෘත භාෂාවේ බහුලප්‍රයෝජනයි.

වර්තමාන විභක්ති යෙහි "ති අන්ති සි ථ මි ම" යන පූර්වවූ පද සය පරස්මෛ පදයි.

"තෙ අන්තෙ සෙ ව්හෙ එ ම්හෙ" යන පදසය ආත්මනෙ පදයි.

"ආත්මගාමි චෙත්පදං ආත්මනෙපදං පරගාමි චෙත්පදං පරස්මෛපදං" ඉදින් තමාකරා යන සුළුපදයක් නම් ආත්මනෙ පදනම් වෙයි- ඉදින් අනුන් කරා යන සුළුපදයක් නම් පරස්මෛ පදනම්වෙයි- සංස්කෘත ව්‍යාකරණ කාරයන්ගේ මතයි.

"ද්වෙ ද්වෙ පඨම මජ්ඣිමුත්තම පුරිසා" යනසූත්‍රයෙන් දෙකක් දෙකක් බැගින් ප්‍රථම මධ්‍යම උත්තම පුරුෂයයි කියනලදී.

පරස්මෛ පදයන්කෙරෙහි "ති අන්ති" ප්‍රථමපුරුෂයි "සි ථ" මධ්‍යමපුරුෂයි "මි ම" උත්තම පුරුෂයි-ආත්මනෙ පදයන් කෙරෙහි "තෙ අන්තෙ" ප්‍රථම පුරුෂයි "සෙ ව්හෙ" මධ්‍යම පුරුෂයි "එ ම්හෙ" උත්තමපුරුෂයි-ඒ දෙකදෙකවූ තන්හි පූර්වය එකවචනයියපරය බහුවචනයි"ති සි මි තෙ සෙ එ" යනමේ එකවචනයි.

"අන්ති ථ ම අන්තෙ ව්හෙ ම්හෙ" යනමේ බහුවචනයි— මත්තෙහිද මෙසේයි.

ධාතුව සකර්මකවූකල කර්තෘකාරක කර්මකාරක දෙකයෙදේ.
අකර්මකවූකල කර්තෘකාරක භාවකාරක දෙක යෙදේ.

කම්මාපෙක්ඛා ක්‍රියායස්ස, හොති ධාතු සකම්මකො,
කම්මා න පෙක්ඛා කිරියා, යස්සසොහි අකම්මකො.
"සකම්ම කම්හා ධාතුම්හා, කත්තුකම්මෙසු හොන්තිතෙ
"නභාවෙ කම්ම රහිතම්හා, කත්තුභාවෙසු නාපරෙ"

යස්ස, යම්ධාතුවක් හුගේ; ක්‍රියා, ක්‍රියාතොම; කම්මාපෙක්ඛා, (කටංකරොති, ඔදනංපචති, ගාමංගච්ඡති; යනාදි තන්හි කටං ඔදනං, ගාමං යනාදි කර්මසෙයින්) කර්මය අපෙක්ෂාකොට ඇත්තේද; සොධාතු, ඒධාතුතෙම; සකම්මකො හොති, සකර්මකවේ; යස්ස, යම් ධාතුවක්හුගේ; කිරියා, ක්‍රියාතොම; කම්මා නපෙක්ඛා; (තිට්ඨති සෙති යනාදියෙහි මෙන්) කර්මාපෙක්ෂාවක් නැත්තීද; සොහි, ඒ(ධාතු)තෙම වනාහි; අකම්මකො, අකර්මකයි.

තෙ ඒ(ආඛ්‍යාත ප්‍රත්‍යයෝ) සකම්මකම්හා ධාතුම්හා, සකර්මක

ධාතුව කෙරෙන්; කත්තුකම්මේසු, කර්තෘ කර්මයන් කෙරෙහි හොන්ති, වෙත්; න භාවෙ, භාවකාරකයෙහි නොවෙත්; කම්ම රහිතම්හා, අකර්මක ධාතුවකෙරෙන්; කත්තුභාවෙසු, කර්තෘ කාරක භාවකාරක දෙක්හි; හොන්ති, වෙත්; අපරෙන, අනිකෙහි හෙවත් කර්මකාරකයෙහි නොවේ.

"පච පාකෙ" යනාදිවූ ධාතුයි—ඊට "ති අන්ති" යනාදිප්‍රත්‍යය එක්වූ සිද්ධවන පද ක්‍රියා පදයි.

ධාතුවම ක්‍රියාවනොවේ ධාතුවෙන් නිපන් පදය ක්‍රියාවයි.
ඒ කර්තෘ කර්ම සහිතකොට පදමාලාවෙහි ගලපන ලදී.

සො, හෙතෙම; ඔදනං, බත; පචති, (දැන්) පිසේ.
තෙ, ඔහු තුමූ; ඔදනං, බත; පචන්ති, (දැන්) පිසෙත්.
ත්වං, තෝ; ඔදනං, බත; පචසි, (දැන්) පිසෙහි.
තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචථ, (දැන්) පිසහු.
අහං, මම; ඔදනං, බත; පචාමි (දැන්) පිසමි.
මයං, අපි; ඔදනං, බත; පචාම, (දැන්) පිසමු.

මේ පරස්සෙපද පදයි.

මෙහි පචති යන ක්‍රියාපදය සො යන කර්තෘහා සම්බන්ධ හෙයින් ඒ ක්‍රියාවෙන් සො යනු උක්තකර්තෘයි ඔදනං යනු අනුක්ත කර්මයි. එහෙයින් සො ඔදනෙ පචති කියා අනුක්තකර්මය බහුවචනවුවද නිර්දෝෂයි- පචති යනු එකවචන හෙයින් සො යනු එක වචනද ප්‍රථම පුරුෂහෙයින් නාමයද යෙදීම නියමයි.
ඉදින් පචති යන්නේ කර්තෘව තෙ කියා බහුවචන වුවද ත්වං කියා තුම්හශබ්දයෙන් වුවද සදෝෂයි.

කර්තෘකාරක ක්‍රියාවෙන් කර්තෘ උක්තවන හෙයින් ප්‍රථමා විභක්තියම යෙදිය යුතුවේ- තෘතියා විභක්තිය අනුචිතයි.
ඒබැවි බුද්ධප්‍රියාචාර්‍ය්‍යයන් විසින් මෙසේ කියනලද්.

"කත්තුනො'භිහිතත්තාච ආඛ්‍යාතෙන න කත්තරි,
තතියා පඨමා හොති ලිඞ්ගත්ථං පන පෙක්ඛිය„

ආඛ්‍යාතෙන, ආඛ්‍යාත ක්‍රියාපදයවිසින්; කත්තුනො, කර්තෘහු ගේ අභිහිතත්තාච, උක්තබැවින්ද; කත්තරි, කර්තෘ කාරකයෙහි, න තතියා, තෘතියා විභක්තියනොවේ; ලිඞ්ගත්ථංපන, ලිඞ්ගාර්ථය වනාහි; පෙක්ඛිය, බලා; පඨමා හොති, ප්‍රථමා විභක්තිය වේ.

ආත්මනෙ පදයෝ "අත්තනො පදනි භාවෙච කම්මනි,, යන සූත්‍රයෙන් භාව කර්මයන කාරක දෙක්හී යෙදුම නියමකොට නැවත "කත්තරිච,,යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහිද නියමකර ණලද හෙයින් කර්තෘයෙහිද යෙදෙත්—එහෙයින් කර්තෘ කාරකයෙහි ආත්මනෙ පදමාලාවද යොදන ලදී.

සො, හෙතෙම; ඔදනං, බත; පචතෙ,පිසේ.
වර්ත්මාන විභක්තිහෙයින් දැන්යයි හැගේ.
තෙ, ඔහුතුමු; පචන්ති, පිසෙත්; ඔදනං නියාහෝ ඔදනෙ නියාහෝ මච්ඡං සූපං යනාදියක්හෝ කර්ම්වේ.
ත්වංපචසෙ, තෝ පිසෙහි.
තුමෙහ පචවෙහ, තෙපි පිසහු.
අහං පචෙ, මම පිසමි.
මයං පචාමෙහ, අපි පිසමු.

මෙහිද පචතෙ, යනක්‍රියාවෙන් සො යනු උක්තකර්තෘයි; ඔදනං යනු අනුක්ත කර්මයි, පචන්තෙ යන්නෙන් තෙ යනු උක්ත කර්තෘයි ඔදනං යනාදිය අනුක්ත කර්මයි, පචසෙ යන්නෙන් ත්වං යනු උක්තකර්තෘයි ඔදනං යනාදියක් අනුක්ත කර්මයි, මේ පිළිවෙළින් උක්තානුක්ත විධිය දතයුතුයි— භූ යන ධාතුවෙන්ද ආත්මනෙ පදයෙහි භවතෙ භවන්තෙ යනාදි පදමාලාව් රූප සිද්ධිආදියෙහි යොදන ලද්දේ නුමුත් බුද්ධදෙසනාවෙහි භූ යන ධාතුවෙන්නිපන් ආත්මනෙ පදික ක්‍රියා අප්‍රකාශයි.

සංස්කෘතෙහි මෙන් පරස්මෛපදී ධාතුවයයි සැලකිය යුතුයි-ආත්මනෙපද ඇත්තේ ස්වල්පයකි.

පදක්‍රමයනම් —පචති යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරකාරක පරස්මෛපදී ප්‍රථම පුරුෂෙක වචනාඛ්‍යාත ක්‍රියාපදය— පචන්ති යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘ කාරක පරස්මෛපදී ප්‍රථම පුරුෂ බහු වචනාඛ්‍යාතක්‍රියාපදය— පචසි යනු වර්තමානවිභක්ති සකර්මකධාතු කර්තෘකාරකපරස්මෛ පදී මධ්‍යමපුරුෂෛකවචනාඛ්‍යාතක්‍රියාපදය—පචථ යනුවර්තමා නවිභක්ති සකර්මකධාතු කර්තෘකාරක පරස්මෛපදී මධ්‍යම පුරුෂ බහුවචනාඛ්‍යාතක්‍රියාපදය—පචාමි යනු වර්ත්මානවිභක්ති සකර් මකධාතු කර්තෘකාරක පරස්මෛපදී උත්තම පුරුෂෛක වචනාඛ්‍යා ත ක්‍රියාපදය- පචාම යනු වර්ත්මාන විභක්ති සකර්මක ධාතු කර්තෘ කාරක පරස්මෛපදී උත්තම පුරුෂ බහුවච නාඛ්‍යාත ක්‍රියා පදය —පචතෙ යනු වර්තමාන විභක්ති සකර්මකධාතු කර්තෘකාරක

ආත්මනෙපදී ප්‍රථමපුරුෂෛකවචනාඛ්‍යාත ක්‍රියාපදය-පචන්තෙ යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක ආත්මනෙපදී ප්‍රථමපුරුෂ බහුවචනාත්‍යාඛ්‍යාත ක්‍රියාපදය—පචසෙ යනු වර්තමානවිභක්ති සකර්මකධාතු කර්තෘකාරක ආත්මනෙපදී මධ්‍යම පුරුෂෛක වචනාඛ්‍යාත ක්‍රියාපදය- පචවෙහ යනු වර්තමාන විභක්ති සකර්මකධාතු කර්තෘකාරක ආත්මනෙපදී මධ්‍යම පුරුෂ බහුවචනාඛ්‍යාත ක්‍රියාපදය- පචෙයනු වර්තමාන විභක්ති සකර්මකධාතු කර්තෘකාරක ආත්මනෙපදී උත්තම පුරුෂෛක වචනාඛ්‍යාත ක්‍රියාපදය- පචාමසෙ යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක ආත්මනෙපදී උත්තමපුරුෂ බහුවචනාඛ්‍යාත ක්‍රියාපදය—මේපිළිවෙළින් මත්තෙහිදු දතයුතු-මේආත්මනෙපදයෝ පාලියෙහි සවල්පය පරස්මෛ පදයෝ බහුලයි. වර්තමාන විභක්තියෙන් අවසන්නොවූ පවත්නා ක්‍රියාව කියනු ලැබේ- අඛ්‍යාතය කාලත්‍රයක් ඇත්තේයයි සංක්‍ෂෙපයෙන් කියනලද්දේද විස්තරවසයෙන් කාල සයකට බෙදෙනබැව් බුද්ධ ප්‍රියාචාර්‍ය්‍යයන් විසින් කියනලදී- හේ මෙසේයි.

"ඉධපන කාලස්ස අතීතානාගත පච්චුප්පන්නා 'නත්ති පරිකප්පකාලාති පත්තවසෙන ඡධා භින්නත්තා පච්චුප්පන්නෙනාති විසෙසෙති"

මෙහිවනාහි කාලය අතීතය, අනාගතය, වර්තමානය, ආනත්තිය, පරිකප්පය, කාලාතිපත්තිය, යනවසයෙන් ෂඩාකාරය කින් බිඳුනුහෙයින් ප්‍රත්‍යුත්පන්න යෙහියයි වෙනස්කෙරේ.

පරොක්ඛා හියත්තනී අජ්ජතනී විභක්තිතුන අතීතකාලයයි.

භවිස්සන්ති විභක්තිය අනාගතකාලයයි, වර්තමාන විභක්තිය වර්තමානකාලයයි, පඤ්චමී විභක්තිය වර්තමාන වර්තමානාසන්නානාගතය ආශ්‍රයකරමින් ආඥාවෙහි පවත්නා හෙයින් ආනත්ති කාලයයි- සත්තමී විභක්තිය වර්තමානාසන්න කාලය ආශ්‍රය කරමින් අනිශ්චිත ක්‍රියාව කියනහෙයින් පරිකප්ප කාලයයි, කාලාතිපත්තිය අතීතක්‍රියා විපත්තිය ප්‍රකාශකරණ හෙයින් කාලාතිපත්ති කාලයයි- මේ කාල සය අතුරෙන් ප්‍රත්‍යුත්පන්න කාලයෙහි වර්තමාන විභක්තියවේ.

"ආරද්ධා 'නිට්ඨිතං කිච්චං වත්තමානන්ති වුච්චති,
වත්තමාන සමීපඤ්ච වත්තමාන'න්ති වුච්චති"

ආරද්ධ, පටන්ගන්නා ලද්දාවූ; අනිට්ඨිතං, නොනිමියාවූ;

තිට්ඨං, කටයුත්ත; වත්තමානමෙහි, වර්තමාන කාලයෙහි; වුච්චති, කියනුලැබේ; වත්තමාන සමීපඤ්ච, වර්තමානයට ආසන්නකාලයද; වත්තමානන්ති වුච්චති, වර්තමානයයි කියනුලැබේ- වර්තමානයට ආසන්නකාලයද වර්තමානනම්වේ-"කුතොනුත්වං ආගච්ඡසි රාජගහතො ආගච්ඡාමීති ආදිසුපන පච්චුප්පන්න සමීපෙ වත්තමාන වචනං" යනු බුද්ධප්‍රියාචාර්යයන් විසින් කියනලදී. ත්වං, තො; කුතොනු ආගච්ඡසි, කොතැනින් එන්නෙහිද; රාජගහතො ආගච්ඡාමි, රජගහනුවරින් එමි; ඉතිආදිසුපන, මේආදි තන්හි වනාහි; පච්චුප්පන්න සමීපෙ, වර්තමානයට ආසන්න කාලයෙහි; වත්තමානවචනං, වර්තමාන වචනයයි- මෙහි රජගහනුවරින් අවුත් ආවෙමි නොකියා එමිකීමයි- "එකංසමයං භගවා සාවත්ථියං විහරති"යනාදිතන්හි විහරති යනාදිය අතීත කාලයෙහි වර්තමාන විභක්තියයි ඇතම්අයගේ මතයි. ඒ එසේ නොවියයුතුයි.

එසේ භාග්‍යවතුන්වහන්සේගේ වැඩවිසීම නියා නැවත ආමන්ත්‍රණ ධර්මදෙශනාදිය ඒ වාසයකරණ කාලයට අන්තර්ගත කරණබැවින් නොනිමි කාලයක් කීමහෙයින් වර්තමාන ක්‍රියාමය "ආමන්තෙසි" යනාදින් කියනලද ආමන්ත්‍රණාදිය එපමණින් ඉක්මුනබව හැඟෙන. හෙයින් අතීත ක්‍රියාවසයෙන් ම යොදනලදී- "ච්ඡිටායති චිටිචිටායති" යනාදියද එසේමය "තෙනඛොපන සමයෙන අග්ගික භාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනෙ අග්ගිපජ්ජලිතො හොති" යනතන්හි ගිනිදිලිහීම අවසන්නොව පවත්නා කල්හිම කෙරුණ බ්‍රාහ්මණයාගේ ආක්‍රොශාදිය කියනහෙයින් අනිට්ඨිත ක්‍රියාවක්කීමයි- මෙවචන කියන කාලයට ඒකාලය අතීතකාලය වීම මීට ප්‍රමාණ නොවේ- පුරුෂත්‍රය මිශ්‍රවීමෙහි පරපුරුෂය යෙදේ.

"සබ්බ සමෙතාභිධානෙ පරොපුරිසො" සියල්ලන්ගේ එකට කීමෙහි පරපුරුෂයයි- "එකකාලා න මෙවාභිධානෙචායං" මේ එකම කල්ඇත්තාවුන්ගේ එකටකීමෙහි වේ-ඒකෙලෙසද "සො පචති ත්වඤ්චපචසි" යනදෙක එකතුකොට කීමෙහි "තුම්හෙ පචථ" කියත්—ප්‍රථම මධ්‍යම පුරුෂදෙකින් පරපුරුෂය මධ්‍යම පුරුෂයයි— එහෙයින් "තුම්හෙපචථ"කියා පරවූ පුරුෂය යොදනලදී—"සොචපචති අහඤ්චපචාමි" යනදෙක එකටකීමෙහි "මයං පචාම"—ත්වඤ්චපචසි අහඤ්චපචාමි යනදෙක එකතුකොටකීමෙහි "මයංපචාම"-සො චපචති ත්වංච පචසි අහඤ්චපචාමි යන පුරුෂත්‍රය එකතුකොට කීමෙහිද "මයංපචාම" සොඅපචි

අහංපචාමි යනාදී තන්හි භිනනවූ කාල ඇතිහෙයින් එකතු කොට කිමක් නැත්තේය—

මේ ක්‍රමයෙන් සො සුඛීභවති, තෙ සුඛිනො භවන්ති, ත්වං සුඛීභවසි, අහං සුඛීභවාමි' මයං සුඛීභවාම, යනාදීන් "භූසත්තායං" යන ධාතුවෙන්ද භූ වාදී ගණයෙහි වෙනධාතුවලින්ද ක්‍රියායෙදීය යුතු— ගච්ඡති, ගච්ඡන්ති; ගච්ඡසි, ගච්ඡථ, ගච්ඡාමි, ගච්ඡාම, යනාදීන් ක්‍රියාමාලා යෙදියයුතු—

## කර්මකාරක ආත්මනෙපදයෙහි.

තෙන තයා මයා වා සො ඔදනො පච්චතෙ, ඔහුවිසින් හෝ තාවිසින් හෝ මාවිසින් හෝ ඒබත පිසනු ලැබේ—වා යන නිපාතාර්ථයෙන්- තෙහි තුම්හෙහි අම්හෙහිවා-යි බහුවචන හෝ කර්තෘකාරකයෙහි යෙදිය යුතුයි—උන්විසින් හෝ තොපවිසින් හෝ අපවිසින් හෝ ඒබත පිසනුලැබෙයි යනාදිවසයෙනි- මෙහි පචන ක්‍රියාවහෙයින් සුඛාවබොධවන පිණිස ඔදන ශබ්දය යුක්තකලේනමුත් "සො පච්චතෙ" යනපමණත් යොග්‍යමය-තෙනවා තයාවා මයාවා ඔහුවිසින් හෝ තාවිසින් හෝ මාවිසින් හෝ, තෙපච්චන්ති, ඔහුතුමූ පිසනු ලබත්; තෙන යනාදියෙන් කැමතිඑකක් කර්තෘවසයෙන් ගතයුතු.

තෙන, ඔහුවිසින්; ත්වං, තෝ; පච්චසෙ, පිසනු ලැබෙහි.
මයා, මාවිසින්; තුම්හෙ, තොපි; පච්චව්හෙ, පිසනුලබහු.
අහං තෙන පච්චෙ, මම ඔහුවිසින් පිසනුලබමි;
මයං තයා පච්චාමසෙ, අපි තාවිසින් පිසනුලබමු-

කර්මකාරකයෙහි ආත්මනෙ පදයෝ-"අත්තනොපදානි පරස්ස පදත්තං" යන සූත්‍රහෙයින් කිසිතැන පරස්මෛපද බවට යෙත් එකල "පච්චති" යනාදී පදයෝ වෙත්- තෙන තයා මයා තෙහි තුම්හෙහි අම්හෙහිවා සො පච්චති, ඔහුවිසින් හෝ තාවිසින් හෝ මාවිසින් හෝ උන්විසින් හෝ තොපවිසින් හෝ අපවිසින් හෝ හෙතෙම පිසනුලැබේ.

තෙපච්චන්ති, ඔහුතුමූ පිසනු ලබත්- තෙන යනාදී කොයියම් කර්තෘවක් හෝ යොදගතයුතු.

ත්වං පච්චයි, තෝ පිසනු ලබන්නෙහි.
තුම්හෙ පච්චථ, තෙපි පිසනු ලබන්නහු.
අහං පච්චාමි, මම පිසනු ලබමි.
මයං පච්චාම, අපි පිසනු ලබමු.

මීට "පච" යන ධාතුවහැර අන්‍යධාතුවකින්ද යොදා එසේම දතයුතු.

"හන" යන ධාතුව හිංසාවෙහි හෝ නැසීමෙහි වේ-එහි කර්ම කාරකය.

සො චොරෙහි හඤ්ඤතෙ.
තෙ චොරෙහි හඤ්ඤන්තෙ.
ත්වං චොරෙහි හඤ්ඤසෙ.
තුමෙහ චොරෙහි හඤ්ඤවෙහ.
අහං චොරෙහි හඤ්ඤෙ.
මයං චොරෙහි හඤ්ඤාමසෙ.

සො,හෙතෙම; චොරෙහි, සොරුන්විසින්; හඤ්ඤතෙ, වෙහෙසනුලැබේ නොහොත් නසනුලැබේ.

තෙ, ඔහුතුමූ; චොරෙහි, සොරුන්විසින්; හඤ්ඤන්තෙ, වෙහෙසනුලබත්; ත්වං, තෝ; චොරෙහි, සොරුන්විසින්; හඤ්ඤසෙ වෙහෙසනු ලබන්නෙහි; යනාදීන් දතයුතු- පච යනධාතුවෙන්මෙන් දතයුතු.

"ආඛ්‍යාතෙන අවුත්තත්තා තතියා හොති කත්තරි,
කම්මස්සා 'භිහිතත්තා න දුතියා පඨමා'ව'ධ"

ආඛ්‍යාතෙන, ආඛ්‍යාතයාවිසින්; අවුත්තත්තා, අනුක්ත බැවින්; කත්තරි, කර්තෘකාරකයෙහි; තතියාහොති, තෘතීයාවේ; කම්මස්ස, කර්මයනමා; අභිහිතත්තා, උක්තබැවින්; දුතියාන, විතියා නොවේ; ඉධ, මෙහි; පඨමාඑව, ප්‍රථමාමවේ.

"ඔදනො පච්චතෙ" කියාහෝ "සොපච්චතෙ" කියාහෝ යෙදෙනතැන "පච්චතෙ" යන කර්මකාරක ක්‍රියාවෙන් කර්මයම කියනුලැබේ, කර්තෘ නොකියනුලැබෙයි- යම්හෙයකින් ක්‍රියාවෙහි කර්තෘවක් වියයුත්තේද එහෙයින් කර්තෘවක් විද්‍යමාන බව හැඟේ-ඉන්නිසා උක්තවූ කර්මයෙහි ප්‍රථමාවේ- අනුක්තවූ කර්තෘවෙහි සවනීයවූ තෘතීයාවේ-පච්චතෙ යන කර්මක්‍රියාවවිසින් කියන ලදහෙයින් "සො"යනු නොහොත් ත ශබ්දයෙන් කියනලද ඔදනො යනු උක්තකර්මයි- ඒ ක්‍රියාව විසින් නොකියනලද හෙයින් "තෙන" යනුහෝ "තයා" යනුහෝ "මයා" යනුහෝ "තෙහි" යනුහෝ "තුමෙහහි" යනුහෝ "අමෙහහි" යනුහෝ අනුක්ත කර්තෘයි- "සූදෙන ඔදනො පච්චතෙ" කීකල "ඔදනො" යනු උක්ත කර්මයි- "සූදෙන" යනු අනුක්තකර්තෘයි- අනුක්තයෙහි පුරුෂ

නියමයක් හෝ වචන නියමයක් හෝ නොවේ— උක්තයෙහි පුරුෂ වචන නියමයවේ- විමපමණක් කියන ක්‍රියාව භාවකාරක ක්‍රියාවයි- "අද්දබබ වුත්තිනො භාවසෙසකත්තා එකවචනමෙව" අද්දබබවුත්තිනො, ද්‍රව්‍යයක නොපවත්නාවූ; භාවසෙසකත්තා, භවයා තමාඑකක් බැවින්; එකවචනමෙව, එකවචනයමවේ- ගෙද ප්‍රථමපුරුෂයෙහි පමණය, තෙන තයා මයාවා භූයතෙ, ඔහුවිසින් හෝ තා විසින් හෝ මාවිසින් හෝ විමයි- ඔහුගේ හෝ තාගේ හෝ මාගේ හෝ මේකාලයෙහි විමයන අර්ථයි- රූපසිද්ධියෙහි "භූයතෙ දෙවදත්තෙන සම්පති භවන නත්‍යජෝ" දෙව්දත්හු විසින් විමයි මේකාලයෙහි විමයයන අර්ථයි- වර්තමාන කර්මකාරක ප්‍රථමපුරුෂ බහුවචනයට "රෙ" යනාදෙසවේ—එසේකල පච්චරෙ කියාදවේ.

---

2. "පඤ්චමී තු අනතු හි ථ මි ම තං අනතං ස්සු වෙහා එ ආමසේ"

යන සූත්‍රයෙන් තු අ න්තු හි ථ මි ම තං අනතං ස්සු වෙහා එ ආමසෙ, යනමේ දොළස පඤ්චමී විභක්තිනම් වේ.

"ආණත්‍යා සිට්ඨෙ 'නුත්තකාලෙ පඤ්චමී."

ආණත්ති ආසිට්ඨෙ, ආඥවක්ද ආසිංසනයක්ද ඇත්තාවූ; අනුත්තකාලෙ, සමීපයෙහි කියනලද කාලයෙහි; පඤ්චමී, පඤ්චමී විභක්තියවේ

ආසිංසනනම් නොපැමිනියාවූ ඕනෑකරණලද දෙයක් ප්‍රාර්ථනාකිරීමයි- අනුත්තකාලයනම් වර්තමානාදී නියමයකින් නොකියනලද කාලයයිද කියත්-මෙහිආඥාක්‍රියාව බොහෝසේ මධ්‍යමපුරුෂයෙහි පවත්නේය- ආසිංසනය මේවිභක්තියෙහි ප්‍රධාන වේ- එසේකල සො සුඛීභවතු, හෙතෙම සැපඇතිවේවා; තෙ සුඛිනො භවන්තු, ඔහුතුමූ සැපඇත්තෝ වෙත්වා.

යනාදින් දතයුතු- ආඥාවෙහිද "සූදෙ ඔදනං පචතු" අරක් කැමිතෙම බත පිසන්නේය නොහොත් බත පිසතු- සිංහල ව්‍යාකරණයෙහි විධි ක්‍රියාය ආශීර්ණී විධික්‍රියායයි කියනලද් දේ මේක්‍රියාවයි.

සො, හෙතෙම; ඔදනං පචතු, බත පිසේවා.
තෙ, ඔහුහු; ඔදනං පචන්තු, බත පිසත්වා.
ත්වං, තෝ; ඔදනං පච, බත පිසෙහිවා; නොහොත් පිසව.
තුම්හෙ, තෙපි; ඔදනං පචථ, බත පිසව්වා, නොහොත් පිසව්.
අහං, මම; ඔදනං පචාමි, බත පිසෙම්වා.
මයං; අපි; ඔදනං පචාම, බත පිසමුවා.
ආත්මනෙ පදයෙහි පචතං යනාදියටත් මෙසේමයි.

කර්මයෙහි, තෙන තයා මයාවා, ඔහුවිසින් හෝ තාවිසින් හෝ මාවිසින් හෝ; තෙහි තුම්හෙහි අම්හෙහිවා, ඔවුන්විසින් හෝ තොපවිසින් හෝ අපවිසින්හෝ; සොඔදනො, ඒබත; පච්චතං, පිසනු ලැබේවා; තෙහි, ඔවුන්විසින් හෝ; තෙඔදනා, ඒබත් තුමූ; පච්චන්තාං, පිසනුලබත්වා; යනාදින් අර්ථකියයුතු.

පරස්මෛපදබවට පැමිනිකල්හි-පච්චතු පච්චන්තු යනාදි පද පනතිය යෙදේ, කර්තෘකාරකයෙහි පචතු යන ක්‍රියාවවිසින් කිය නලදහෙයින්සො යනු උක්තකර්තෘයි, ඔදනං යනු අනුක්තකර්මයි එහි ඔදනෙ කියා බහුවචනහෝ වියයුතුයි-ත්වං, මං, යනාදින් තුම්හ අම්හ ශබ්දවලින් කර්මයක් විනමුත් අවිරුද්ධයි- උක්තවූ කර්තෘයෙහි නාම ප්‍රථමාවිභක්ති එකවචනම වියයුතුයි.

කර්මයෙහි "පච්චතං" යන කර්මකාරක ක්‍රියාව විසින් කියනලද හෙයින් සො යනු උක්තකර්මයි— ඔහුවිසින් නොකියනලද හෙයින් තෙන යනාදින් යමක් අනුක්ත කර්තෘයි—නාම තුම්හාම්හ ශබ්දයන් අතුරෙන් යෙදෙන්නාවූ යම් ශබ්දයක එකවචනහෝ බහුවචනහෝ අනුක්තකර්තෘයෙහි අනියතයි- තෘතීයාවිභක්තිය පමණක් නියතවේ.

රූපසිද්ධියෙහි.

"විධිනිමන්තණ'ජ්ඣෙසනා'නුමති පත්ථනා පත්ත කාලාදි සුච පඤ්චමී"

විධි, විධානකිරීමය; නිමන්තණ, පැවැරීමය; අජ්ඣෙසන, ආරාධනාකිරීමය; අනුමති, අනුදැනීමය; පත්ථනා, ප්‍රාර්ථනාකිරීමය; පත්තකාල, පැමිනිකාලය; ආදිසු, මේආදීන්හි; පඤ්චමී, පඤ්චමී විභක්තියවේ.

විධිම්හි, විධියෙහි- ඉධපබ්බතො හොතු, මෙහි පර්වතයක් වේවා; අයං පබ්බතො සුවණ්ණමයො හොතු-මේපර්වතය තෙම

රන්මුවාවේවා මේආදියයි- විධි ක්‍රියාවෙහි ගාමං ගච්ඡ යනාදිය දවේ- නිමන්තනෙ, පැවැරීමෙහි; "අධිවාසෙතු මෙ භන්තෙ භගවා භොජනං"-ස්වාමීනි භාග්‍යවතුන්වහන්සේ මාගේ භොජනය ඉවසාවා- ඉධ නිසීදතු භවං, පින්වත්තෙම මෙහි හිඳිවා.

අජ්ඣෙසනෙ, ආරාධනාවෙහි; "දෙසෙතු භන්තෙ භගවා ධම්මං"ස්වාමීනි භාග්‍යවතුන්වහන්සෙ ධර්මය දේසනා කෙරේවා

අනුමතියං, අනුදැනීමෙහි; "පුච්ඡවාසව මං පඤ්හං" ශක්‍රය මා ප්‍රශ්න පිළිවිසුව, නොහොත් ශක්‍රය මගෙන් ප්‍රශ්නවිචාරව.

පවිසතුභවං ඉධ නිසීදතු, පින්වත්තෙම ඇතුල්වේවා මෙහි හිඳිවා- පත්ථනා යාචනා, ප්‍රාර්ථනාව යාඥාවයි; එහි "දදාහි මෙ ගාමවරානි පඤ්ච" මට ගම්වරපසක් දෙව; "එකමෙව නයනං දෙහි" මට එකඇසක් දෙව.

පත්තකාලෙ-පැමිනිකාල යෙහි; සම්පත්තො තෙ කාලො කට කරණෙ කටං කරොතු භවං- කළාල්කිරීමෙහි තට කලපැමිනියේය; පින්වත්තෙම කළාලක් කෙරේවා— මේආදියවේ.

අනාගතාසිංසන විභත්තියත්ද පාළියෙහි පෙනේ-ඒමෙසේයි. සඤ්චරිත්ත සංඝාදිසෙස නිදානයෙහි "ආගච්ඡතු මෙ මාතා මං නෙස්සතු" මෙ මාතා, මාගේමව; ආගච්ඡතු, ඒවා; මං නෙස්සතු, මා ගෙණයන්නේවා;—මහාඛන්ධකයෙහි- "අනු සා වෙස්සතු" (කම්මවාක්‍ය) අස්වන්නේවා; මෙසේහෙයින් අනාගත ආසිංසන අජ්ඣෙසනාදියෙහි පවත්නා අනාගතාසිංසන විභත්තියක් ඇතිවේ—එය කාත්‍යායනාදි ආචාර්‍ය්‍යවරයන් විසින් ව්‍යාකරණයට නොනගණ ලද්දේවීනුමුත් ඒවිභත්තියත් සමග ආඛ්‍යාතයට නව විභත්තියක් ඇතිබැව් දතයුතු.

අනාගතාසිංසන යෙහි- ස්සතු, ස්සන්තු, ස්සාහි, ස්සථ, ස්සාමි, ස්සාම, ස්සතං, ස්සන්තං, ස්සස්සු, ස්සව්හො, ස්සෙ, ස්සාමසෙ-යන දෙළසවේයයි සැලකියයුතු—පචම් භාවයෙහි භූයතං යනුවෙ. ච්මවේවායි අර්ථයත්.

---

3. "සත්තමී එය්‍ය, එය්‍යුං, එය්‍යාසි, එය්‍යාථ, එය්‍යාමි, එය්‍යාම, එථ, එරං, එථො, එය්‍යව්හො, එය්‍යං, එය්‍යාමෙහ"-යන සූත්‍රයෙන් එය්‍ය, එය්‍යුං, යනාදි දෙළස සප්තමී විභක්තියි—ආත්මනෙපද පරස්සෙපදවසයෙන් දතයුතු.

“අනුමති පරිකප්පනෙසු සත්තමී” අනුමති පරිකප්පනෙසු, අනුදැනීම් අනියමින් සැලකීම් යන අර්ථයන්හි; සත්තමී, සප්තමී විභක්තිය වේ—අනුමතියනම්, කත්තුමිච්ඡතො පරස්ස අනුජානනං අනුමති-කත්තුං, කරන්ට; ඉච්ඡතො, කැමතිවූ; පරස්ස, අනිකෙකුට; අනුජානනං, අනුදැනීම; අනුමති, අනුමතිනම් වේ.

නිරූපණං පරිකප්පො, සැලකීම පරිකල්පනම් වේ-යදිනාම භවෙය්‍යාති සල්ලක්ඛණං නිරූපණං—යදිනාම භවෙය්‍යාති, ඉදින් වන්නේනම් කියා; සල්ලක්ඛණං, සැලකීම; නිරූපණං, නිරූපණයයි—හෙතුකිරියා සම්භවෙ ඵලකිරියා සම්භවො පරිකප්පොව—හෙතුකිරියා සම්භවෙ, හෙතුක්‍රියාවක් ඇතිවීමෙහි; ඵලකිරියා සම්භවො, ඵලක්‍රියාවක් ඇතිවීම; පරිකප්පොව, පරිකල්පයමය.

අනුමති ක්‍රියාව-“සංඝො ඉත්ථන්නාමං උපසම්පාදෙය්‍ය” සංඝතෙම මෙනම්ඇත්තා උපසම්පදා කරන්නේනේය—යනාදියෙහි වේ—පරිකල්පක්‍රියාව—“යදිසො පඨමවයෙ පබ්බජෙය්‍ය අරහා භවෙය්‍ය”—ඉදින් හෙතෙම ප්‍රථමවයසේ පැවිදි වන්නේනම් රහත් වන්නේය—යනාදීතන්හි වේ.

“සොඔදනං පචෙය්‍ය” යනාදියෙහි—සො, හෙතෙම; ඔදනං, බත; පචෙ, පිසන්නේය; පචෙය්‍ය කියාදවේ, තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පචෙය්‍යුං, පිසන්නාහුය; ත්වං, තො; ඔදනං, බත; පචෙය්‍යාසි, පිසන්නෙහි; තුම්හෙ, තෙපි; පචෙය්‍යාථ, පිසන්නාහු; අහං, මම; පචෙය්‍යාමි, පිසන්නෙමි; මයං, අපි; පචෙය්‍යාම, පිසන්නෙමු;—පරිකල්පාර්ථයට කියනකල පචෙය්‍ය, පිසන්නේනම්—යනාදීන් කියයුතුයි.

හෙතුක්‍රියා ඵලක්‍රියා දෙකට යොදනකල මෙසේ කියයුතුයි-සචෙසො පුඤ්ඤං කරෙය්‍ය සග්ගං ගච්ඡෙය්‍ය—ඉදින් හෙතෙම පින්කරන්නේනම් ස්වර්ගයට යන්නේය-“ අත්ථග්ගහණෙන විධිනිමන්තනාදිසුච සත්තමී” අත්ථග්ගහණෙන, අර්ථශබ්දය ගැණීමෙන්; විධිනිමන්තනාදිසුච, විධානකිරීම පැවැරීම ආදියෙහිද; සත්තමී, සප්තමී විභක්තිවෙයි-කීහෙයින්-විධාන ක්‍රියාදියෙහිද සප්තමිය වේ—සිංහල ව්‍යාකරණයෙහි මේක්‍රියාව අසම්භාවන ක්‍රියායයි කියනලදී.

මීටත් පඤ්චමියට කීපරිද්දෙන් අනුක්තකාලය දතයුතු.

සම්භරතැනෙක එය්‍යුං යන්නට, උ යන ආදෙශයද; එය්‍යාසි යන්නට, එ යන ආදෙශයද වනහෙයින්- ගමුධාතු ආදියෙන්

ක්‍රියාවචන වනතාන්හි ගවෙසයුං යන්නෙහි ගවෙසුං කියාද ගවෙසයාසි යන්නෙහිගවෙස කියාද මේආදිය යෙදෙනබව දතයුතු—කම් භාව දෙක ඝටකියනලද පරිච්ඡේදයෙන් දතයුතු—භාවයෙහි භූයතෙ, එම වන්නේනම් යි අර්ථ කියයුතු— සබ්බධාතුක විභක්ති පිළිවෙලට යොදනපිණිස මේලඟට හියත්තනිය යොදනුලැබේ—එහෙයින් පරොක්ඛාව පසුකරණලදී.

---

4. "හියත්තනී ආ ඌ ඔ ත්ථ අ ම්හා ත්ථ ත්ථුං සෙ ව්හං ඉං ම්හසෙ"

යනසූත්‍රයෙන් ආ යනාදි දොළස හියත්තනී විභක්තිනම් වේ.

පරස්සෙපද අත්තනෙපද දෙක්හි සයක් සයක් බැගින් දතයුතු.

"හියොප්පභූති පච්චක්ඛෙ හියත්තනී"

හියොප්පභූති, ඊයේදවස පටන්කොට; පච්චක්ඛෙ, ප්‍රත්‍යක්‍ෂවූ ක්‍රියායෙහි; හියත්තනි, හියත්තනී විභක්තියවේ—ප්‍රත්‍යක්‍ෂ ක්‍රියාවනම් ඉන්ද්‍රියගම්‍යවූ දෙය කියන ක්‍රියාවයි-ඇයින් දැකීම් ආදියෙන් තමන්ට ප්‍රත්‍යක්‍ෂ දෙයයි.

"අපච්චක්ඛෙ අතිතෙ" යනුද මේසූත්‍රයට අනුවෘත්තව වැටෙන හෙයින් අප්‍රත්‍යක්‍ෂවූ අනුන්ගෙන් ඇසීම් ආදියෙන් දැනගත් දෙය කියන ක්‍රියායෙහිද මේ විභක්තියවේ-පාලියෙහි සාමාන්‍යාතීතයෙහි මේක්‍රියාව බොහෝසේ පෙනේ-හියත්තනි අජ්ජතනී කාලාතිපත්ති තුනෙහිම ධාතුවට පූර්වයෙන් කිසිතැනක අකාරයක් ආගමවසයෙන් වැටේ.

සො අභවා, යනාදි ක්‍රියාපදයෝවෙත් "සො ඔදනං අපචා"යනාදියෙහි—සො, හෙතෙම; ඔදනං' බත; අපචා, පිසී; ඊයේ පටන් පූර්වයෙහි පිසීකියාත් අර්ථකියත්-සිංහලභාෂාවෙහි අතීත ක්‍රියාව එකක්හෙයින් පිසී යයි අර්ථකිම යොග්‍යවේ—තෙ, ඔහු තුමූ; අපචූං, පිසූ; ත්වං, තෝ; අපචො, පිසුවෙහි; තුම්හෙ, තොපි, අපචත්ථ, පිසුවහු; අහං, මම; අපචං, පිසුවෙමි; අයන්නෙන් පරව ක්වචිධාත්වාදි සූත්‍රයෙන් නිග්ගහීතාගමව අපචං කියාද උත්තම පුරුෂ එකවචනය වේ—මයං අපචම්හා, අපි පිසුවෙමු; අත්තනොපදයෙහිද මෙසේම අර්ථකියයුතු-අපචා යනාදිය හුදකලා වූවද සො යනාදීන් කර්තෘ අධ්‍යාහාර කරණුලැබේ.

අරියපරියෙසන සුත්‍රාදියෙහි "ආලාරං කාලාමං එතදවොචං"—යනාදීන් මේ විභක්තිය අතීතයෙහි පෙනේ-ජාතක ගාථාවල මේවිභක්තියේ ආත්මනෙ පදය බොහෝසේ පෙනේ.

"වජ්ඣපාණං පිතරං අවොචයිං-පඤ්චාල රට්ඨඤ්ච අහං පසාදයිං"—යනාද්යෙන් දතයුතු.

කම්යෙහි—තෙන තයා මයාවා සො ඔදනො අපච්චථ-ඔහු විසින්හෝ තාවිසින්හෝ මාවිසින් හෝ ඒ ඔදනයතෙම හෙවත් ඔදනවූ හෙතෙම-අපච්චථ, පිසනුලැබී—යනාදීන් අර්ථ කියයුතු—මේ විභක්තිවල හෙවත් පඤ්චම් ආද්යෙහි භාවයක් පිළිවෙළින් පෙනෙන තුමූත් පාළියෙහි බොහෝසේ නොපෙනේ.

ආචාය්‍යීවරයෝද ඒපිණිස බොහෝසේ විස්තර නොකළෝ-මෙහි අහූයථ අතීතයෙහි වීමයන අර්ථයි—මෙහි වත්මාන පඤ්චමී සත්තමී හියත්තනී සතරට සව්ධාතුක සංඥව කරණලද්-අනික් විභක්ති අසව් ධාතුකයි—ඉකාරාගම කිරීමෙහි අසව් ධාතුක ප්‍රත්‍යය පරකල වෙයියන ප්‍රයොජනයයි—එතකුදුවූවත් සව්ධාතුක සංඥඇති විභක්තීන් සියළුධාතුවල යෙදෙන බවත් අසව්ධාතුක විභක්තීන් ඇතම් ධාතුවල පමණක් යෙදෙන බවත් සැලකිය යුතු

---

5. "පරොක්ඛා අ උ එ ත්ථ අ මහ ත්ථ රෙ ත්ථො වෙහො ඉ මෙහෙ"

යනසූත්‍රයෙන් අ යනාදි දොළස පරොක්ඛා විභක්තිනම් වේ-පරස්සෙමපද ආත්මනෙ පදවසයෙන් සය සය දතයුතු— මේ විභක්තියේද් ධාතුවේ මුලඅකුර දෙක වීමහා විභක්ති ප්‍රත්‍යය ව්‍යඤ්ජනාදිවූව ඊටපෙරටුව ඉකාරයෙක් වීමදවේ—"අපච්චක්ඛා පරොක්ඛාතීතෙ"—අපච්චක්ඛ, ප්‍රත්‍යක්ෂනුවූ හෙවත් තමන්ඇසින් දැකීම් ආදිය නොකළාවූ, අතීතෙ, පසුගිය ක්‍රියාවෙහි; පරොක්ඛා, පරොක්ෂා විභක්තිය වේ—තමන් ප්‍රත්‍යක්ෂයෙන් නොදත්දෙය කීමෙහි මේවිභක්තියවේ.

සො කිර රාජා බභූව—හෙතෙම රජවිලූ.

"සො ඔදනං පපච" හෙතෙම බත පිසීලූ-"තෙපපචු" ඔහුතුමූ පිසූලූ—යනාද්න් අනුමාන වචනයෙන්මේ විභක්තියෙහි කියයුතු—දෙසනාපාලියෙහි මේ විභක්තිය බහුලව නොපෙනේ.
"බ්‍රූ" වාචායං යනධාතුවට ආහ යනාදෙසයෙන් ආහ ආහු යන ක්‍රියාවචන දෙක පරොක්ෂා විභක්තියබැව් පෙනේ- කාතාක

යන ව්‍යාකරණයෙහි "බූ හූ න මා ග හූ වා පරොක්ඛායං" යන සූත්‍රයෙන් භූයන ධාතුවට ආහ යනාදෙසය කියනලදී.

මොග්ගල්ලායන ව්‍යාකරණයෙහි "අ ආ ඊයවා ගො බ්‍රූස්ස" යන සූත්‍රයෙන් පරොක්‍ෂා අ ආද්‍ය පරකල්හි ආහ යනාදෙසය කියන ලදී-බ්‍රහ්මජාලසූත්‍රාදියෙහි "සොඑව මාහ" යනාදීන් ආහ යනුද රතනසූත්‍රයෙහි "සමාධිමානන්තරිකංයමාහු" යනතන්හී ආහු යනුද මෙආදිතන්හි පෙනේ- මේතැන්වල අප්‍රත්‍යක්‍ෂ යයි නො කියහැකිය එහෙයින් ප්‍රත්‍යක්‍ෂ තන්හිද පරොක්‍ෂා විභක්තිය වෙයි සිතියයුතු-සංස්කෘත භාෂාවෙහි පරොක්‍ෂා ක්‍රියාව බහුලව පෙනේ—පාණිනි ව්‍යාකරණයෙහි තුන්වෙනි අධ්‍යායේ දෙවෙනිපාදයේ එක්සිය සොළොස්වෙනි සූත්‍රය "පරොක්‍ෂෙලිට්"

අප්‍රත්‍යක්‍ෂයෙහි ලිට් විභක්තියවෙයි යන අර්ථයි— "භූතානද්‍යතනපරොක්‍ෂාර්ථ වෘත්තෙර්ධාතෝර්ලිට් ස්‍යාත්" භූතානද්‍යතන පරොක්‍ෂාර්ථවෘත්තෙඃ, පසුගියාවූ අදනුවූ ප්‍රත්‍යක්‍ෂනුවූ අර්ථයෙහි පවත්නාවූ; ධාතොඃ, ධාතුවකෙරෙන්; ලිට්ස්‍යාත්, ලිට් විභක්තියවේ—පරොක්‍ෂාවිභක්තියට පාණිනියයන්ගේ ලිට්යන නාමයයි- "චකාර" බභූව "පපාච" යනාදීන් මේවිභක්තිය සංස්කෘතෙහි බහුලයයි "චකාර ස්‍යාම න්‍යාචකොරනෙත්‍රා"- යනාදි තන්හී දතයුතුයි—දෙසනාපාලියෙහි මේ විභක්තිය බොහෝ යෙදීමක් නොවේ-ප්‍රකරණවල බොහෝසේ පෙනේ අත්තනගලුවංස යෙහි "ගන්ත්වා සයං අපදතාය සුසොච නුනං"-"සො කුටසන්ධිගගහණං බුබොධ" යනාදිය බැලියයුතු- පිටකවල මේ විභක්තිය ඉතාස්වල්ප තැනෙක යෙදෙනනුමුත් පරොක්‍ෂා විභක්තියයි නම්වසයෙන්එකක් ගත්තාක්මෙන් ස්වල්පතැනෙක පෙනෙන්නාවූඅනාගතායිංසනායද විභක්තියක්කොට ගත්කල්හී ආඛ්‍යාතයෙහි නව විභක්තිය කැයි දැඩිකොටම සිතියයුතු—කම් භාව දෙක යට කී පරිද්දෙන් දතයුතු.

---

6 "අජ්ජතනි ඊ උං ඔ ත්ථ ඉං ම්හා ආ ඌ සෙ ව්හං අ ම්හෙ"

යන සූත්‍රයෙන් ඊ ආදි දොළස අජ්ජතනි නම්වෙ- පරස්සෙම පද අත්තනොපදදෙක්හී සයසයබැගින් බෙදීපවති-"සමීපෙජ්ජතනී"-සමීපෙ, ආසන්නවූ අතීතකාලයෙහි; අජ්ජතනි, අජ්ජතනී නම් විභක්තියවේ-මේ සූත්‍රයට "අතීතෙ අපච්චක්ඛෙවා" යනු අනුවෘත්තවන හෙයින් ප්‍රත්‍යක්‍ෂවූ හෝ නුවූහෝ පසුගිය ලඟකාලයෙහි යම් ක්‍රියාවක් කියන විභක්තිය අජ්ජතනියයි දතයුතු.

"සො ඔදනං අපච්," හෙතෙම බත පිසී—ආසන්නවූ අතීත කාලයෙහි යයි හැඟේ—අකාරය පූර්වීම තිබිතැනෙක හෙයින් මෙම ක්‍රියාව පචීකියාද වේ—දීඝය හ්‍රස්වවීමත් තිබිතැනක හෙයින් "අපචි" කියාද "පචි" කියාදවේ—තෙ අපචිංසු, ඔහුතුමුපිසූ; පචිංසු කියාදවේ— උං යන විභක්තියට විකල්පයෙන් ඉංසු ආදෙසවීමෙන් අපචිංසු යනාදිය වූහෙයින් එසේ නුවූතැන "අපචුං" කියාද "පචුං" කියාද වේ.

ත්වං අපචො, තෝ පිසුවෙහි යනාදීන් දතයුතු.

කර්මයෙහි—තෙන තයා මයා වා සො ඔදනො අපච්චා—ඔහු විසින් හෝ තාවිසින් හෝ මාවිසින් හෝ ඒබතතෙම පිසනු ලැබී යනාදීන් දතයුතු.

භාවයෙහි-අභූසිත්ථ යනාදියයි-ආසන්නවූ අතීතයෙ හිටීමයි.

මේ විභක්තියෙන් අදම පසුගිය වේලේ කළ ක්‍රියාවද කියනු ලැබේ— "මායොගෙ සබ්බකාලෙච"- යන සූත්‍රයට "හීයත්තනී අජ්ජතනී' යනු වැටේ-හීයත්තනි අජ්ජතනිච හීයත්තනී අජ්ජතනිවිභක්තිදෙකද; මායොගෙ, මා යන නිපාතයාගේ යෙදීමෙහි; සබ්බකාලෙ, හැමකල්හි වේ—මායන නිපාතය සමග යෙදෙන කල කාලනියමයක් නොව විධික්‍රියාවමෙන් වේ—"ච" යන්නෙන් පඤ්චමියද එසේවේ. ඒමෙසේයි—මා අගමා, නොයව මාභායි, බියනොවෙව; මාතෙභවතු අන්තරායො, තට අන්තරායක් නොවේවා.

---

7 "භවිස්සන්ති ස්සති ස්සන්ති ස්සසි ස්සථ ස්සාමි ස්සාම ස්සතෙ ස්සන්තෙ ස්සසෙ ස්සවෙහ ස්සං ස්සා මෙහ"

යනසූත්‍රයෙන් ස්සතිආදි දොළස භවිස්සන්ති විභක්තිනම් වේ.

"අනාගතෙ භවිස්සන්ති" අනාගතෙ, නොපැමිනි මතුකාලයෙහි; භවිස්සන්ති, භවිස්සන්ති විභක්තියවේ.

මතු කරණ ක්‍රියාවක් කියන්නේ මේ විභක්තියෙනි.

සො අනාගතෙ රාජා භවිස්සති, හෙතෙම අනාගතයෙහි රජවන්නේය; සො ඔදනං පචිස්සති, හෙතෙම (මතු)බතපිසන්නේය; තෙපචිස්සන්ති, ඔහුතුමූ පිසන්නාහුය; මතුයනවචනය නැත්තේනමුත් "අන්නේ අන්නාහු" යනාදී සිංහල ප්‍රත්‍යයව ලින්ද අනාගතකාලය හැඟේ-අන් ආදිය "නේ" යුක්තකළකල

අනාගතයෙහි ත ශබ්දකාරක එකවචන යෙහිද "අන්නෝ අන්නාභූ" යනාදිය බහුවචනයෙහිද විමයි.

ත්වංපච්ඡස්සසි' තෝ පිසන්නෙහි;
තුම්හෙ පචිස්සථ, තොපි පිසන්නාහු;
අහං පචිස්සාමි, මම පිසන්නෙමි;

මයං පචිස්සාම, අපි පිසන්නෙමු-ආත්මනෙ පදයෙහිද මෙසේයි.

කර්මයෙහි පච්චිස්සතෙ, පිසනු ලබන්නේය; කියාවේ—මේආදී ක්‍රමයෙනි— භාවයෙහි භූයිස්සතෙ, අනාගතයෙහි විමයි.

ඓ විභක්තිය කිසිතැනෙක අතීතයෙහිද වේ—බුද්ධප්‍රියාචාර්යයන්විසින් මෙසේ කියනලදී.

"අතිතෙපි භවිස්සන්ති තංකාල වචනි * ච්ඡයං,
අනෙකජාති සංසාරං සන්ධාවිස්සන්ති ආදිසු"

තංකාල වචනිච්ඡායං, තත්කාලය හෙවත් පසුගිය ඒකාලය කියනු කැමැත්තෙහිලා; අතීතෙඅපි, අතීත කාලයෙහිද; භවිස්සන්ති, භවිස්සන්ති විභක්තියවේ-(ඒමෙසේයි)අනෙකජාති සංසාරං, නොයෙක්ජාති සංසාරයෙහි; සන්ධාවිස්සං, දිව්වීමි; ඉතිආදීසු, මේ ආදිතන්හිවේ—මෙහි ඒකාලය කියනු කැමැත්තෙහියයි කියන ලද්—පාණිනීය ව්‍යාකරණයෙහි "අභිඥාන වචනෙ ලෘට්" යනු තුන්වන අධ්‍යාය දෙවෙනිපාද එක්සිය දෙළොස්වෙනි සූත්‍රයයි.

අභිඥාන වචනෙ, සලකුණුවසයෙන් අඟවන වචනයෙහි; ලෘට්, ලෘට්විභක්තියවේ ඊට පාණිනීය වෘත්තියෙහි මෙසේකියන ලදී "ස්මෘතිවචන උපපදෙ භූතානද්‍යතන කාලික ක්‍රියාවෘත්තෙ ධාතොර්ලෘට්ස්‍යාත්" ස්මෘතිවචනෙ උපපදෙ, සිහිකරණ වචන යක් පූර්වපදකොට ඇති කල්හි; භූතානද්‍යතනකාල ක්‍රියා වෘත්තෙඃ, පසුගිය අදනොවූ කාලයඇති ක්‍රියාවෙහි පවත්නාවූ; ධාතොඃ, ධාතුවකෙරෙන්; ලෘට්ස්‍යාත්, ලෘට් ක්‍රියාවවේ; උදාහරණ "අභිජානාසි දෙවදත්ත කාශ්මීරෙෂු වත්ස්‍යාමඃ" දෙව්දත්ත, එම්බා දෙවදත්තය; කාශ්මීරෙෂු වත්ස්‍යාමඃ, කාශ්මීර ජනපදයෙහි පැවැතුනෙමු, අභිජානාසි, දන්නෙහිද?

"ස්මරසි කෘෂ්ණ කාශ්මීරෙෂු වත්ස්‍යාමඃ"-කෘෂ්ණ, එම්බාකෘෂ්ණය; කාශ්මීරෙෂු, කාශ්මීර ජනපදයෙහි; වත්ස්‍යාමඃ, පැවතුනෙමු; ස්මරසි, සිහිකරන්නෙහිද?-මේ ලෘට්ක්‍රියාව ස්වභාවයෙන් අනා

---

* "ඉච්ඡායං" යනු "ඉච්ඡයං"යි සුබොච්චාරණයද වෘත්තිය නොබිඳීමද පිණිස හ්‍රස්වයි.

ගතශෙෂකාල යෙහිපවතී-ඒබව "ලඃවිශෙෂෙච" යනාදි සූත්‍රව ලින්ද තයුතු- මෙසේ මේකාලය ඍහිකරණ තන්හි අතීතකාල යෙහි භවිස්සන්තිය යෙදිමයි, සැමතැනම ඒකාලය කියවිකලැ නොවෙයි දතයුතු.

---

8 කාලාතිපත්ති ස්සා ස්සංසු ස්සෙ ස්සථ ස්සං ස්සම්හා ස්සථ ස්සිංසු ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හසෙ,

යනසූත්‍රයෙන් ස්සා යනාදිදෙළස කාලාතිපත්ති නම්වේ.

පරස්මෛපදාදියෙහි සයසයබැගින් යෙදේ- "ක්‍රියාතිපන්නෙ තීතෙ කාලාතිපත්ති" ක්‍රියාතිපන්නෙ, ක්‍රියාවවිපත්තියට පැමිනියාවූ; අතීතෙ, අතීතකාලයෙහි; කාලාපත්ති, කාලාතිපත්ති විභක්තියවේ; ස්සා යනු කිසිතැනෙක හ්‍රස්වවිමෙන් "ස්ස" තියාවේ.

මේ ක්‍රියාව යෙදෙනපරිදි— "සචෙ සො පඨමවයෙ පබ්බජ්ජං අලභිස්ස අරහා අභවිස්ස" ඉදින් හෙතෙම පළමුවෙනි වයසේ පැවිදිලැබුවානම් රහත්වි— මෙයින් පළමුවෙනි වයස පැවිදි නොලත්හෙයින් රහත්නොවියයි හැගේ— සමහරතැන සත්තමියෙන් පූර්වක්‍රියාව යෙදේ "සචෙ තබ්බිරුද්ධං නාභවෙය්‍ය තදුපකරණංවා ලභෙථ ඔදනං අපචිස්සා"— ඉදින් ඊටවිරුද්ධයක් නූනානම් ඊට උපකරණහෝ ලැබුවානම් බත පිස්සේයි—මෙයිනුත් විරුද්ධදේ ලැබූන හෙයිනුත් උපකරණ නොලැබූන හෙයිනුත් බත නොපිසූබව හැගේ—එහෙයින් ක්‍රියාවිපත්ති.යයි.

මෙතැනදි සත්තමි විභක්තියද අතීතයෙහි පෙනේ—බුද්ධවචනයෙහි කාලාතිපත්තිය පූර්ව සත්තමිය පරව යෙදිම බොහෝ සේපෙනේ— ඒ මෙසේයි "රූපඤ්චබො ඉදං භික්ඛවෙ අත්තා අභවිස්සා නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍ය" භික්ඛවෙ, මහණෙනි; ඉදං රූපඤ්චබො, මේ රූපයදවනාහි; අත්තා අභවිස්ස, ආත්මයවිනම්, ඉදංරූපං, මේරූපය: ආබාධාය, රොගපීඩීස; නසංවත්තෙය්‍ය, නොපවත්නේය—මෙසේ පඤ්චස්කන්ධයන් සඳහා වදළ තැන්වල කාලාතිපත්තිය පූර්ව සත්තමිය පරව තිබේ.

"අභවිස්ස" විනම් යනාදින් යෙදෙන හෙයින් අනියම ක්‍රියායයිසැලකිය යුතුයි—සිද්ධනුවූ ක්‍රියාව කියනහෙයින් ක්‍රියාවගේ ඉක්මීමක් නැතද අතීතවශයෙන් ව්‍යවහාරයි.

අතීතයෙහි වියයුත්තක් නොවිය යනඅර්ථයි.

කාලාතිපත්තිය අතීතඅනියමය සත්තමිය වර්තමානානාගත අනියම ක්‍රියායයි හැගේ.

“සචෙසො උපකරණං අලභිස්සා ඔදනං අපචිස්ස”

ඉදින් හෙතෙම උපකරණ ලැබීනම් බත පිසී— “සචෙතෙ උපකරණං අලභිස්සංසු ඔදනං අපචිස්සංසු’ ඉදින් ඔහුතුමූ උපකරණ ලැබුවෝනම් බත් පිසුවෝය—යනාදීන් අර්ථ කියයුතු.

කර්මයෙහි “සචෙ සූදෙන උපකරණං ලභිස්සථ ඔදනෝ අපච්චිස්සථ” ඉදින් අරක්කැමියා විසින් උපකරණ ලබනලද්දී නම් බතතෙම පිසනුලැබී—භාවයෙහි— “දෙවදත්තෙන අභූයිස්සථ” දෙව්දත්හුගේ වීම වීනම් කියයුතුයී.

කාලස්ස අතිපතනං කාලාතිපත්ති, ක්‍රියාවගේ විපත්තියට පැමිනීම කාලාතිපත්ති නම්වේ —

## විභක්ති නාමාර්ථ.

වර්තමාන—වත්තතීති වත්තමානා, පවති යන අර්ථයෙන් වර්තමාන නම්—යම් ක්‍රියාවක් කොට නිමනොකරණ ලද්දීනම් වර්තමානයී-කොට ස්වල්පයක් පසුගිය ක්‍රියාවක්ද මේ විභක්තියෙන් කියනබැව් ප්‍රකාශයී—නොබෝ කලකින් වෙන්ටතිබෙන ක්‍රියාවක්ද වර්තමානයට ආසන්නහෙයින් මේ විභක්තියෙන් කියත්—පඤ්චසත්තිකක්ඛන්ධක යෙහි-“පුරෙ අධම්මො දිප්පති ධම්මො පටිබාහියති”—නොබෝකලකින් අධර්මය බලලයී ධර්මය පසුබසීයි-යනාදියෙන් එය පෙනේ—පඤ්චමී විභක්තියේ වචනාර්ථයනම් පස්වෙනි යනුයී—තුමූත් පඤ්චමී සත්තමී යනු පූර්වාචාර්‍ය්‍යයන් විසින් කරණලද සංඥා යයී සමහර ආචාර්‍ය්‍යයන් විසින් කියනලදී—අර්ථ නොසලකා රූඪිවසයෙන් කරණලද නම්ය යන මතයයී—ආණත්ති ආසිංසන යන අර්ථයන්ට නියමකරණලද ක්‍රියාවට පඤ්චමීයන නමයී—අනුමති පරිකප්පාර්ථයන්හි නියම කරණලද ක්‍රියාවට සත්තමී යන නමයී—තුමූත් මහාශබ්දනීතිකාරාචාර්‍ය්‍යයන් විසින් එය ප්‍රතික්ෂෙපකොට පසපූරවණ අර්ථයෙන් පඤ්චමීය සතපූරවණ අර්ථයෙන් සත්තමීයයී කියනලදී-

එහි කාතන්ත්‍රයන සංස්කෘත ව්‍යාකරණයට සමසේ කාත්‍යායන ව්‍යාකරණය කරණලද බවද, කාතන්ත්‍රයෙහි සංස්කෘත භාෂාවට අනුරූපලෙස ක්‍රියාවිභක්ති දසයද, කාත්‍යායනයෙහි පාලිභාෂාවට අනුරූපලෙස ක්‍රියාවිභක්ති අටක්ද තිරීමෙහි පිළිවෙළ වෙනස් වීනුමුත් නිරුක්තියෙහි ගළපනලද පරිද්දෙන් කාලවසයෙන් වෙන්කරණ කල්හි පඤ්චමී විභක්තිය පස්වෙනි තැනටද සප්තමී විභක්තිය සත්වෙනි තැනටද පත්වෙන බව

කියනලදී—කාත්‍යායන ක්‍රමයෙන් යෙදෙන පරිදි මෙසේ කිය
නලද්දේය.

“පරොක්ඛා හීයත්තන'ජ්ජතනී භවිස්සන්ති වසෙන එකන්තා
තීතානාගත කාලිකා වතසෙසා, වත්තමානා පනෙකා යෙව සා
පටිපාටියා ගණියමානා පඤ්චමං ඨානං භජති එවමෙතස්මිං
වත්තමාන සංඛාතෙ පඤ්චමට්ඨානෙ පක්ඛිපිතුං නිරුත්ති නයෙ
න අඤ්ඤත්ථිකාලිකාති සංඛං ගතං අත්ථුත්තකාලිකාති වුත්තං වි
භත්තිං පඤ්චමී භූතාය වත්තමානාය සමට්ඨානත්තා පඤ්චමී ස
ඤ්ඤං කත්වා ඨපෙසි–තතොපරං තංපඤ්චමිං ඡට්ඨට්ඨානෙ ඨපෙ
ත්වා පරොක්ඛා හීයත්තනජ්ජතනී භවිස්සන්ති වත්තමානා පඤ්ච
මීති එවං ගණනවසෙන ඡ විභත්තියො උපාදිය නිරුත්ති නයෙ
න පරිකප්ප කාලිකාති සංඛං ගතං අත්ථුත්ත කාලිකාති වුත්තං වි
භත්තිං සත්තන්නං සංඛානං පූරණෙන සත්තමී සඤ්ඤං කත්වා
ඨපෙසි—කාලාතිපත්තියා පන අතීතා'නාගත කාලිකත්තා තං
වජ්ජෙත්වා අයං විනිච්ඡයො කතො”—

පරොක්ඛා හීයත්තන'ජ්ජතනී භවිස්සන්ති වසෙන, පරොක්ෂා
හීයත්තනී අජ්ජතනී භවිස්සන්ති යනවසයෙන්; එකන්තාතීතා
නාගත කාලිකා, එකාන්තයෙන් අතීතවූ (තුන)හා අනාගත
කාලිකවූ (එක)ද; වතසෙසා, සතරෙක; වත්තමානා පනෙකා
යෙව, වර්තමානය වනාහි එකක්මය; සා, ඒ වර්තමානතොමෝ;
පටිපාටියා ගණියමානා, පිළිවෙළින් ගණිනුලබන්නී; පඤ්චමං
ඨානං භජති, පස්වෙනිතැන සෙවනය කරයි; එවං, මෙසේ; එ
තස්මිං වත්තමාන සංඛාතෙ, මේ වර්තමාන සංඛ්‍යාතවූ; පඤ්චම
ට්ඨානෙ පක්ඛිපිතුං, පස්වෙනිතන්හි බහන්ට; නිරුත්තිනයෙන,
නිරුක්ති ක්‍රමයෙන්; අඤ්ඤත්ථි කාලිකාති සංඛංගතං, අඤ්ඤත්ථි
කාලඇත්තිය යන ගණනට ගියාවූ; අත්ථුත්තකාලිකාති වුත්තං,
සම්පයෙහි කියනලද කල්ඇත්තියයි කියන ලද්දාවූ; විභත්තිං,
විභක්තිය; පඤ්චමීභූතාය, පස්වෙනිවූ; වත්තමානාය සමානට්ඨා
නත්තා, වර්තමාන විභක්තියට සමතැන් ඇතිබැවින්; පඤ්චමී
සඤ්ඤංකත්වා, පඤ්චමී නම්කොට; ඨපෙසි, තැබී—තතොපරං,
ඉන්මත්තට; තංපඤ්චමිං, ඒපඤ්චමිය; ඡට්ඨට්ඨානෙ ඨපෙත්වා, ස
වැනිතන්හීතබා; පරොක්ඛා–පෙ–පඤ්චමීති, පරොක්ෂාදි- පඤ්ච
මී අවසන් විභක්තිහුයයි; එවං, මෙසේ; ගණනවසේන, ගණන්
වසයෙන්; ඡවිභත්තියො, විභක්ති සයක්; උපාදිය, අල්වාගෙණ;
නිරුත්තිනයෙන, නිරුක්ති ක්‍රමයෙන්; පරිකප්පකාලිකාති, පරි
කල්ප කාල් ඇත්තියයි; සංඛංගතං, ගණනට පැමිනියාවූ; අත්ථු

ත්තකාලිකානි, අනුත්ත කාලිකයයි; වුත්තං විභත්තිං, කියනලද විභක්තිය; සත්තනනං සංඛානං, සත්ගණනුන්ගේ; පූරණෙන, පිරීමෙන්; සත්තමී සඤ්ඤං කත්වා, සත්තමී නම්කොට; ඨපෙසි, තැබී—කාලාති පත්තියාපන, කාලාතිපත්තිය වත්තාහි; අතීතා නාගත කාලිකත්තා, අතීත අනාගත කල්ඇතිබැවින්; තං වජ්ජෙත්වා, එයහැර; අයං විනිච්ඡයො, මේ විනිශ්චය; කතො, කරණ ලද්දේය—මෙපමණ දක්කොට කියනලද්දේ වීනමුත් මෙහිඅදහස - පරොක්ඛා හීයත්තනී අජ්ජතනී තුන අතීතකාලයටද භවිස්සන්ති විභක්තිය අනාගත කාලයටද තැබූකල සතරක—පවත්නා කාලයට කියනලද වත්මාන විභක්තිය පස්වෙනිවෙයි—ආණත්තියට නියමකළ පඤ්චමී විභක්තියද වත්මාන විභක්තියටම ආසන්න කල්ඇති බැවින් වත්මානයේ ගණනට පැමිනිහෙයින් හෙද පස්වෙනිය—තුමුත් එය එසේ නම්කොට හවෙනි වසයෙන් තබා පරිකල්ප කාලයට නියම කළ විභක්තිය සත්වෙනි තන්හී තබනලදිය—එහෙයින් අනුජීවසයෙන්ම පඤ්චමී සත්තමී විභක්ති දෙකයයි මෙසේ කාල වසයෙන් ගණන්කොට කියනලදී.

කාලාතිපත්තිය අතීත අනාගත කාලදෙක ඇත්තියයි කියනලදී—“සො වෙ සෙව යානං අලභිස්සා ආගච්ඡිස්සා” හෙතෙම ඉද්න් හෙට යානාවක් ලබන්නේනම් එන්නේය යනාදි උදාහරණ කියනලද්—මේ උදාහරණ ශබ්දනීති කාරකයන් විසින්ම ගළපනලද හෙයින් ප්‍රයොජනවත් නොවේ—ඉදින් බුද්ධවචනාදියෙහිනම් ප්‍රයොජනයි—එබැවින් කාත්‍යායනාචාර්‍ය්‍යාදීන් විසින් කාලාතිපත්තියට කියනලද අතීත කාලයම පිළිගතයුතුයි—එසේත් ක්‍රියාතිපත්තිය හෙයින් කාලසඞ්ඛ්‍යාවට නොගැණ හැරියයුතු කරුණු පෙනේ—

පරොක්ෂාව—“අක්ඛස්මා ඉන්ද්‍රියස්මා පරං බාහිරන්ති පරොක්ඛං”—අක්ඛනම්වූ ඉන්ද්‍රියයෙන් පරය පිටය යන අර්ථයෙන් පරොක්ඛනම්වේ—පරොක්ඛ භවා ක්‍රියා පරොක්ඛා—පරොක්ඛයෙහිවූ ක්‍රියාව පරොක්ඛානම්—එහෙයින් ඇසින් නුදුටු යනාදි ක්‍රමයෙන් ඉන්ද්‍රිය විෂයනුවූ දෙය කියන ක්‍රියාවයි.

හීයත්තනිය-හියොභවා හීයත්තනී-ඊයේවූවා හීයත්තනී නම් තදුපචාරවසයෙන් ඊයේපටන් අතීතයෙහි වූදෙය කියනා ක්‍රියාවයි-අජ්ජතනිය—අජ්ජභවා අජ්ජතනී—අදවූවා අජ්ජතනී නම් උපචාර වසයෙන් අදපටන් අතීතයෙහි වූදෙය කියන ක්‍රියවයි

භවිස්සන්ති විභක්තිය—භවිස්සතිති භවිස්සන්ති—මත්තෙහි

වන්නේනුයි භවිස්සන්ති නම්වේ— භවිස්සන්තියන නාමයද අනාගත ක්‍රියාවක්මෙනි.

කාලාතිපත්තිය—කාලස්ස අතිපතනං කාලාතිපත්ති-ක්‍රියාවේ විපත්තිය නොහොත් සිදුනොවීම කාලාති පත්තිනම්වේ— එහෙයින් සිදුනොවූ ක්‍රියාව කාලාතිපත්ති නමැයි දතයුතු— මෙසේ බුද්ධවචනාද් සුද්ධ මාගධ භාෂාවෙහි ක්‍රියාවිභක්ති අටකි—මාවිසින් විනයපාලියෙන් ගෙණ පෙන්වනලද අනාගතාසිට්ඨ විභක්තියත් සමග නවවිභක්තියකි—එය පූරාණ චාය්‍ය්‍යයන් විසින් නොදක්වන ලද නුමුත් සඞ්ගායනාවලට නැගුණ පාලියේ පේන හෙයින් පිළිගතයුතුමය.

මෙකියනලද වර්තමානාදි විභක්තිලෙස ශුද්ධකර්තෘයෙහි යොදනලද ක්‍රියාමාලා නිමකොට හෙතුකර්ත්‍රීක්‍රියා දතයුතුයි.

වත්තමාන හෙතුකත්තේ—වර්තමාන විභක්ති හෙතුකර්ත්‍රීයෙහි—
"ධාතූහි ණෙ ණය ණාපෙ ණාපයා කාරිතානි හෙතුකත්තේ"—

හෙතුකත්තේ, හෙතුකර්ත්‍රීයෙහි; ධාතූහි, ධාතූන් කෙරෙන්; ණෙ, ණෙ ප්‍රත්‍යයද; ණය, ණය ප්‍රත්‍යයද; ණාපෙ, ණාපෙ ප්‍රත්‍යයද; ණාපය, ණාපය ප්‍රත්‍යය යනමොහු(වෙත්;)—කාරිතානි, ඒප්‍රත්‍යයෝ කාරිතයන නම්ඇත්තෝද වෙත්—කාරිතනම් කරවණලද යන අර්ථ ඇත්තේයි—අරක්කැමිතෙම බත පිසයි කීකල අරක්කැමියාගේ පිසීම් කිරීම හැඟේ කරවීමක් නොහැඟේ "සූදජෙට්ඨො සූදෙන ඔදනං පාචෙති" සූදෙට අරක්කැමියා ලවා බත පිසවයි—නොහොත් සූදෙට අතවැසිලවා බතපිසවයි කීතැන පිසීම් කරවීම හැඟේ—එසේ කරවණතැන හෙතුකර්ත්‍රීක්‍රියාවවේ— ඊටයෙදෙන ප්‍රත්‍යය කාරිතප්‍රත්‍යයයි දතයුතු—ඒවනාහි "ණෙ ණය ණාපෙ ණාපය" යනප්‍රත්‍යය සතරයි— ඒසතරේම "ණ්" යන්න ලොප්කිරීම නියමයි-එසේ කළකල්හි එ, අය, ආපෙ, ආපය, යනු ශෙෂවේ—බැදිඅකුරක් පරවනැති ධාතුවේ මුලඅකුරසම්බන්ධ ස්වරයට වෘද්ධිවේ—අකාරයට ආකාරයද— "ඉඊ" දෙකට එකාරයද "උඌ" දෙකට ඔකාරයද වෘද්ධියි—එසේකල්හී පච යන ධාතුවෙන්—හෙතුකර්ත්‍රී වර්තමාන කර්තෘකාරක ප්‍රථමපුරුෂ එකවචනය"ණෙ"යෙදූතැන-පාචෙති කියාද—"ණය"යෙදූතැන පාචයති කියාද "ණාපෙ" යෙදූතැන පාචාපෙති කියාද—"ණාපය"යෙදූතැන පාචාපයති කියාදවේ- එකම අර්ථයි—සො ඔදනං පාචෙති, හෙතෙම බත පිසවා—විශෙෂවසයෙන් සූදජෙට්ඨො සූදෙන ඔදනං පාචෙති-අරක්කැමි දෙටුතෙම අරක්කැමියා ලවා (දැන්) බතපිසවයි යනා අර්ථයි—

සූදජෙට්ඨා යනු හෙතු කතෘයි—හෙවත් ප්‍රයොජක කතෘයි—සූදෙනයනු ප්‍රයොජ්‍ය කතෘයි—ප්‍රයොජක කතෘ උක්තයි—ප්‍රයොජ්‍යකතෘ අනුක්තයි—ප්‍රයොජ්‍යකතෘ දෙකක්වූව දෙවරක් කාරිත ප්‍රත්‍යය යෙදෙන නුමුත් පළමුවෙනිඑක ලොප්වේ—එසේවූ කලැ—අමච්චො සූදජෙට්ඨෙන සූදෙන ඔදනං පාචෙති—ඇමැතිතෙම අරක්කැමි දෙටුවාලවා අරක්කැමියාලවා (දැන්) බත පිසවයි යන අර්ථයි.

බහු වචනයෙහි—"සූදජෙට්ඨා සූදෙන ඔදනං පාචෙන්ති"- අරක්කැමි දෙටුවෝ තුමූ අරක්කැමියාලවා බත පිසවත්—සූදජෙට්ඨා සූදෙහි ඔදනං පාචෙන්ති කිවත් යෙදේ— මධ්‍යම පුරුෂයෙහි—"ත්වං සූදෙන ඔදනං පාචෙසි"-තෝ අරක්කැමියා ලවා (දැන්) බත පිසවෙහි——නොහොත් පිසවන්නෙහි— "තුම්හෙ සූදෙන ඔදනං පාචෙථ" තොපි අරක්කැමියා ලවාබත (දැන්) පිසවහු "අහං සූදෙන ඔදනං පාචෙමි" මම අරක්කැමියා ලවා බත (දැන්) පිසවමි—"මයං සූදෙන ඔදනං පාචෙම" අපි අරක්කැමියා ලවා බත (දැන්) පිසවමු—"පාචයති පාචයන්ති" යනාදියද මෙසේමය.

පඤ්චමී විභක්ති ආදියෙහිද—පාචෙතු, පිසවාවා, පාචෙය්‍ය, පිසවන්නේය යනාදීන් විභක්තියේ වෙනස බලා භෙෂවර්ණය ඇතිකොට කීය යුතු.

මෙහි භෙෂවර්ණය කුමක්දැයි යන්න හගවතු පිණ්ස නාතන යනයෙහි මෙසේකියනලදී "යොකොචි කරොති තං කුබ්බන්ත මඤ්ඤො කරොහි කරොහි ඉච්චෙවං බ්‍රූවිති අථවා කරොන්තං පයොජයති කාරෙති කාරයති කාරාපෙති කාරාපයති"—යො කොචි, යම් කිසිවෙක් තෙම; කරොති, ක්‍රියාව කෙරේද; තං කුබ්බන්තං, ඒ කරන්නාට; අඤ්ඤො, අනිකෙක් තෙම; කාරොහි කරොහි ඉති, කරව කරවකියා; එවං, මෙසේ; බ්‍රූවිති, කියයී, අථවා, නොහොත්; කරොන්තං, කරණ තැනැත්තා; පයොජයති, යොදයී; (මේඅර්ථයෙහි) කාරෙති යනුවේ—කාරයති කියාද කාරාපෙති කියාද කාරාපයති කියාදවේ.

මෙසේ යමෙක් පිසන්නේනම් ඕහට පිසව පිසවයි කියා අනිකෙක් නියොග කරන්නේනම් "පාචෙති පාචයති පාචාපෙති පාචාපයති" යනවචනවලින් එකක් ඒගැණ කියත්-"යෙකෙචි කරොන්ති තෙ කුබ්බන්තෙ අඤ්ඤෙකරොථ කරොථාති ඉච්චෙවං බ්‍රුවන්ත කාරෙන්ති කාරයන්ති කාරාපෙන්ති කාරාපයන්ති"—යෙකෙචි, යම්කිසි කෙනෙක්; කරොන්ති, කෙරෙද්ද, කුබ්බන්තෙ, කරන්නාවූ; තෙ, ඔවුන්ට; කාරොථ කාරොථ ඉති

කාරව් කාරවිතියා; අඤ්ඤ, අනිකෙක්; භූවනෙන, තියද්ද; කා රෙනති යනාදී වචනයක් ඒගැණ තිගත්-මෙහි කාරණ කාතෘද කාරවණ හෙතුකාතෘද බහු වචනයෙන්ම තියනලද හෙයින්සෑම තන්හිම එසේමයයි නොසිතිය යුතුයි—හෙතුකාතෘ එකක්ව ප්‍රයොජ්‍ය කාතෘහු බොහෝවූව එසේද හෙතුකාතෘ බොහෝව ප්‍රයොජ්‍යකාතෘ එකක්වූවද එලෙස සම්බන්ධය යෙදේ-උක්තකාතෘහුගේ වචනය පරිද්දෙන් ක්‍රියාවයෙදේ.

මේ "ණෙ ණය ණපෙ ණපය" යනප්‍රත්‍යය සතර සෑම ධාතුවලින් පරව එකාකාරයෙන් නොයෙදේ—යෙදෙන පරිදි රූප සිද්ධියෙහි—

> "ණෙණයාව උවණ්ණනතා ආතො චෙ පච්ජිමා සියුං,
> සෙසතො චතුරො චෙවා වාසද්දසසා'නු වුතතිතො"

උවණ්ණනතා, උවර්ණාන්ත ධාතුවකෙරෙන් ණෙණයාව, ණෙ ණය යන ප්‍රත්‍යය දෙකම්වේ; ආතො, ආකාරාන්ත ධාතුව කෙරෙන්; පච්ජිමාචෙසියුං, පසුවූ; ණපෙ ණපය යන දෙකවේ; සෙසතො, සෙසු ධාතුන් කෙරෙන්; චතුරොචෙවා, සතරමහෝ දෙකක් හෝ; වා සද්දසසානු වුතතිතො, වා ශබ්දයාගේ අනුවෘත්තියෙන් වේ—සු යන ධාතුව කෙරෙන් ණෙ ණය දෙක විමෙන් සාවෙති, සාවයති යනාදියවේ—භූ යන ධාතුවෙන් පරව ඒදෙකමවීමෙන්—භාවෙති භාවයති යනාදියවේ—දා යන ධාතුව කෙරෙන් ණපෙ ණපය දෙකවිමෙන් දාපෙති දාපයති යනාදියවේ—මේආදි ක්‍රමයෙන් දතයුතුයි—කාත්‍යායන යෙහි හෙත්වර්ථයෙහි ණල ප්‍රත්‍යයෙක්ද තියනලද්—"අත්ථගගහණෙන ණලපච්චයො හොති— ජොතලති"— අත්ථගගහණෙ න, සූත්‍රයෙහි තියනලද අර්ථශබ්දයාගේ ගැණීමෙන්; ණලපච්චයොහොති, ණලප්‍රත්‍යයෙක්වේ; (උදාහරණය) ජොතලති—ජුත දිත්තියං යනධාතුව කෙරෙන් ණල ප්‍රත්‍යයවූකලැ "ජොතලති" යනුවේ-බබලවයි යනඅර්ථයි-මෙය සූළුවග-"අසිසසවිජොතල ති"යන පාඨයෙහි ආඛ්‍යාතක්‍රියාවිසයෙහිද-මහාදුක්ඛකඛන්ධ සූත්‍රයෙහි "අසිසුපි විජොතලනෙතසු" තියා කිතකක්‍රියාවිෂයෙහිද මේආදිතන්හි පෙනේ "අසිසසවිජොතලති" යනතන්හි හෙත්වර්ථක්‍රියාවක්සේ නොපෙනේ "අසිසුපි විජොතලනෙතසු" යන තන්හිද එසේ නොපෙනේ-සමහර ආචාර්යයන්ගේ මත එසේ නුමුත් "විජොතලති" යනාදි තන්හි කාරිත ප්‍රත්‍යය ලෙස සැලකීම දුෂ්කරහෙයින් ඒ කාත්‍යායනාචාර්යයන්වහන්සේගේ කීම කැයි නොගනිමි—කාත්‍යායන වර්ණනාකාරාචාර්යයන් විසින්ද

මෙය නොපිළිගත්බව හැයේ— කාත්‍යයන වණ්නාවෙහි—

"අඤ්ඤගහණෙන ණලප්පච්චයොහොතීතිපි පාඨො
සො න පොරාණිකො ටීකා ව්‍යඛ්‍යානතො ගහෙත්වා
ඉධප්පනාති"

අඤ්ඤගහණෙන .යනාදි පාඨයක්දවේ ඒ පූරාණ නොවේ ටීකාව්‍යඛ්‍යානයකින් ගෙණ මෙහි තියත්- "ජෙතලනි විජ්ජො තලති" යනාදිතන්හි ජුත යන ධාතුව චුරාදි ගණයෙහි තිසි තැනක විමෙන් ණයප්‍රත්‍යය යෙදිමෙන් යකාරයට "ඥධස්සච" යන සූත්‍රයෙන් ලකාරාදෙශයයි හඟිමි විමසා ගතයුතු.

ධාතුවකට හෙත්වර්ථ ප්‍රත්‍යයක් යෙදිමෙන් අමුතු කර්මයක් යෙදේ-එය ඇතම් තැන කම්වසයෙන්ද ඇතම් තැන අනුක්ත කර්මයෝ අනුක්තකර්තෘයෝ වේ—

"අකම්මා ධාතුයො හොන්ති කාරිතෙතු සකම්මකා,
සකම්මකා විකම්මාස්සු විකම්මාච තිකම්මකා"

අකම්මා ධාතුයො, අකර්මකධාතුහු; කාරිතෙතු, කාරිත ප්‍රත්‍යය වූකල්හි වනාහි; සකම්මකා හොන්ති, කර්මසහිත වෙත්; සකම්ම කා, කර්මසහිත ධාතුහු; විකම්මාස්සු, කර්ම දෙකක් ඇතිවෙත්; වි කම්මාච, කර්ම දෙකක්ඇති ධාතුහුද; තිකම්මකා, කර්ම තුනක් ඇතිවෙත්—

භූ යන ධාතුව අකර්මකයි-කාරිතානාවූ කලැ භාවෙති යනා දිය සිද්ධවෙ— කාරිත නුවූකල "භවති" යන්නේ වේ යන අර්ථ නුමුත් භාවෙති යනතැන භාවනාකෙරේ නොහොත් වඩයි යන අර්ථයි—භික්ඛු සමාධිං භාවෙති, මහණතෙම සමා ධිය භාවනා කෙරේ, නොහොත් වඩා—මෙහි අමුතුවෙන් කර්ම යක්ලැබේ—සික්ඛයන ධාතුව එකකර්මයක් ඇත්තේයි—සො ව්‍යාකරණංසික්ඛති—හෙතෙම ව්‍යාකරණ ඉගෙණගණී—කා රිතවූකලැ සික්ඛාපෙති—ආචරියො අන්තෙවාසිකං ව්‍යාකරණං සික්ඛාපෙති—ආචාර්යතෙම අතවැස්සාට ව්‍යාකරණ උගන්වයි. අන්තෙවාසිකං- ව්‍යාකරණං-නියා කර්ම දෙකවිය-නියන ධාතුව ස්වභාවෙන් කර්මදෙකක් ඇත්තේයි-දාසො භාරං ගාමං නෙති, දාසතෙම බර ගමට ගෙණ යේ-කාරිතප්‍රත්‍යයවූකලැ නයාපෙ ති—සාමි දාසං භාරං ගාමං නයාපෙති—ස්වාමිතෙම දාසයාලවා බර ගමට පමුනුවයි—මෙහි දාසං, භාරං, ගාමං, නියා කර්ම තුන කි—සමහරවිට ප්‍රයොජ්‍යය කරණයෙහි තෘතියා වීමෙන් සාමි දාසෙන භාරං ගාමං නයාපෙති කියාද යේදේ—එසේම .සූද ජෙටෙඨා සූදෙන ඔදනං පාචෙති කියාදවේ—සමහර තැන

සූදං ඔදනං පාචෙති කියහැකිදවේ—මෙයාකාරයෙන් පාචෙතු පාචෙන්තු පාචෙහි පාචෙථ පාචෙමි පාචෙම—යනාදීන් පඤ්චමී සප්තමී ආදි විභක්තිවල පිළිවෙලින් හෙත්වර්ථක්‍රියා පදමාලා යෙදිය යුතුයි—කර්මයෙහිද භාවියතෙ භාවියන්තෙ යනාදීන් යොදා දතයුතු— තෙන සමාධි භාවියතෙ, ඔහුවිසින් සමාධි තොමෝ වඩනු ලැබේ— තෙන සමාධයො භාවියන්තෙ, ඔහුවිසින් සමාධීහු තුමූ වඩනු ලබත්—පාචියතෙ යනාදීන් පචධාතුවෙන්ද යෙදියයුතු—සූද ජෙට්ඨෙන සූදෙන ඔදනො පාචියතෙ, අරක්කැමි දෙටුවාවිසින් අරක්කැමියා ලවා බතතෙම පිසවනු ලැබේ—යනාදීන් අර්ථකීම දතයුතුයි.

ඝටාදි ධාතූන්ගේ වෘද්ධිය කාරිතයෙහි විකල්පහෙයින් ඝටෙති ඝටයති ගමෙති ගමයති යනාදි පදයන්ගේ සිද්ධවීමද දතයුතු—ආචරියො සිස්සං සික්ඛාය ඝටයති—ආචාර්යතෙම ශිෂ්‍යයා ඉගැන්මෙහි උත්සාහ කරවයි—සාමී දාසං ගාමං ගමයති, ස්වාමිතෙම දාසයා ගමට යවයි—ගුහ දුසාදි ධාතුවල කාරිත ප්‍රත්‍යය යෙදුනකල වෘද්ධිනොව දීර්ඝවේ—ගූහයති දූසයති යනාදීන් පදසිද්ධියවේ—ගූහයති, සඟවවයි; දූසයති, කිළුටුකරවයි; යනාදීහු දතයුතු.

ඊප්සාර්ථයෙහි ඛ ඡ ස යන ප්‍රත්‍යයන්ගේ යෙදීමෙහි කරන්ට කැමැති යන අර්ථයෙහි ධාතුවේ මූල ව්‍යඤ්ජනය ස්වරය සමග දෙකව වර්ගයෙහි දෙවෙනි සතරවෙනි අක්ෂරයන්ට පළමුවෙනි තුන්වෙනි අකුරු ආදෙසවන ක්‍රියාද අභිනවයන් විසින් ප්‍රථමකොට ක්‍රම දැනගන්නා පිනිස දතයුතුයි—භුජ යන ධාතුව අනුභව කිරීමෙහිදවේ—අනුභව කරණු කැමැතිවෙයි යන අර්ථයෙහි බුභුක්ඛති යනුවේ—බුභුක්ඛන්ති බුභුක්ඛසි යනාදීන් ක්‍රියාමාලා යෙදිය යුතුයි.

අනුභවයෙහිවූ ඝස යන ධාතුවෙන් වූකල ජිඝච්ඡති යනාදියවේ—මේ ආදියයි.

### නාම ශබ්දයෙන් යෙදෙන ක්‍රියා:

උපමා කිරීමෙහි—පර්වතයක් සමාන කෙරෙයි යන අර්ථයෙහි පබ්බත ශබ්දයකෙරෙන් "ආය" යන ප්‍රත්‍යයක්කොට ඉන් පරකොට වර්තමානාදි විභක්ති යොදත්.

එසේකල්හි—පබ්බතායති කියාවේ—යොගී අත්තානං පබ්බතායති, තපස්වීතෙම තමා පර්වතයක් මෙන් කෙරේ.

ඊය ප්‍රත්‍යය උපමානවූ ශබ්දයාකෙරෙන් යොදා විභක්ති කළකල්හි- පුත්තියති- ගරුසිස්සං පුත්තියති, ආචාර්යතෙම ශිෂ්‍යයා

පුත්‍රයෙක් සමාන කෙරේ—සියළු විභක්තිවලද හෙබඩී යෙහි ද යෙදිය යුතුයි.

තමන්ට කැමැතිය නොහොත් ඕනෑකෙරෙයි යන අර්ථයෙහි—පාත්‍රයක් ඕනෑකිරීමෙහි පත්තා ශබ්දයා කෙරෙන් "ඊය" යන ප්‍රත්‍යය යොදා පත්තීයති ක්‍රියා පද සිද්ධකෙරේ-භික්ඛු පත්තීයති, මහණතෙම තමාට පාත්‍රයක් ඕනෑකෙරේ.

ධාත්වර්ථයෙහි කාරිතමෙන් නාමය කෙරෙන් නය ප්‍රත්‍යය යෙදීමෙන්ද වේ-විසුද්ධ ශබ්දයෙන්-විසුද්ධයති, පිරිසිදුවේ-දළ්හ ශබ්දයෙන්-දළ්හයති, දැඩිකෙරේ-චිර ශබ්දයෙන්-චිරයති, යනාදියද සිද්ධවේ—උපසර්ග පූර්වවද—හත්ථි ශබ්දයෙන් අතිහත්ථයති ඇතා කරණකොට ගෙණ ඉක්මවයි—යනාදිය නාම ශබ්දවලින් යෙදෙන ක්‍රියායි.

පච යනාදී ධාතු භූවාදී ධාතුගණයෙහිය—සියලු ධාතුගණ අටකට බෙදනලදී—ඒ ඒ ගණ වෙන්කිරීම පිණිස විකරණ ප්‍රත්‍යය යොදනලදී-භූවාදී ධාතුගණයට "අ" යන ප්‍රත්‍යයයි-රුධ් යනාදී ධාතු කොටස රුධාදී ධාතු ගණයයි—එහි "අ" යන ප්‍රත්‍යයහා ධාතුවෙ අන්තඅකුරට මුලින් බිඳුවක්වේ—ඊටසන්ධි ක්‍රමයෙන් වර්ගාන්ත අකුර ආදේශවේ—එසේකල රුන්ධති යනාදීන් ක්‍රියාපද සිද්ධියයි—සා සෙනා නගරං රුන්ධති—ඒසේනා තොම නුවර අසුරයි—මේගණයට අයිති "වදි" යනාදී ධාතුන් ගෙන් එලෙස අෂ්ට විභක්තියෙහි ක්‍රියා සිද්ධයි.

දිවු යන ධාතුව ක්‍රීඩාවෙහි වේ—ඒආදි ධාතු කොටස දිවාදී ධාතුගණයයි—එහි "ය" යනප්‍රත්‍යයවේ—එය සමග කර්මයෙහි වනආදේශ පරිද්දෙන් ධාත්වන්තයට ආදෙස වූකල—දිබ්බති යනාදී ක්‍රියා සිද්ධයවේ—බාලොදිබ්බති—ළදරුවා කෙළී—

සු යන ධාතුව ඇසීමෙහිවේ—ඒආදි ධාතුසමූහය සවාදි ගණයයි—එහි ණු, නා උණ යනප්‍රත්‍යයවලින් එකක් ලැබුනපරිද්දෙන් යෙදේ.

උකාරයට වෘද්ධිවීමෙන්— සුණෝති ක්‍රියාවේ— සො ධම්මං සුණෝති, හෙතෙම බණ අසයි යනාදින් ක්‍රියාමාලා දතයුතු.

කී යන ධාතුව විකිණීමෙහි හෙවත් ද්‍රව්‍ය ගණුදෙනු කිරීමෙහිවේ-ඒගණයෙහි "ණා" යන ප්‍රත්‍යය යෙදේ-කී යන්නේ ඊකාරය හ්‍රශ්වවීමෙන් කිණාති යනාදීක්‍රියා සිද්ධයි—වාණිජෝ කහාපණේන ධඤ්ඤං කිණාති, වෙළඳතෙම කහවණුවෙන් ධාන්‍ය විකුටගණී.

ගහ යන ධාතුව ගැණීමෙහිවේ—ඒආදි ධාතු සමූහය ගහා

දි ධාතුගණයයි— ඒගණයෙහි "ජප—ණ්‍යා" යන ප්‍රත්‍යයෝ යෙදෙන පර්ද්දෙන්වෙත්—ධාතුවේ අග හකාරය ලොප්කොට ණ්‍යා යන්න යෙදූකල්හි—ගණ්හාති යනාදින්ද ගහ යන්නට "ඝෙ" යනආදේශය කොට "ජප" යනු එකතුකළකල්හි ඝෙප්පති යනාදින්ද ක්‍රියාසිද්ධයි—ආචරියා සිසෙසා සික්ඛංගණ්හාති ආචාර්‍ය්‍යාගෙන් ශිෂ්‍යතෙම ශික්ෂාවගණී.

තනු යන ධාතුව පැතිරීමෙහි වැටේ—ඒආදි ධාතු සමූහය තනාදි ගණයයි—එහි "ඔ-යිර" යන ප්‍රත්‍යයෝ යෙදෙන පර්ද්දෙන් වෙත්—තනු යන්නට "ඔ" යුක්තකළකල්හි—තනොති යනාදින් පදසිද්ධයි.

කර යන ධාතුවේ රයන්න ලොප්කොට "යිර" යන්න ඒකතු කොට යෙදූකල්හි-කයිරති යනාදිය සිද්ධවේ-චන්‍දො ඔභාසංත නොති—චන්‍ද්‍රතෙම එළිය පතුරුවා- චුර යන ධාතුව සොරකම් කිරීමෙහිවේ—ඒආදි ධාතු සමූහය චුරාදි ගණයයි—එහි "ණෙ ණය" යන ප්‍රත්‍යයෝ කාරිත ප්‍රත්‍යයමෙන් වෙත්.

චොරෙති චොරයති යනාදින් ක්‍රියාමාලා සිද්ධයි.

තක්කරො පරභණ්ඩං චොරෙති, සොරා අනුන්ගේබඩු සොරකම් කෙරේ යනාදින් දතයුතු—ධාතුගණ ප්‍රභෙදය ධාතුපාඨ ධාතුමඤ්ජූසාදියෙන් බලා ඒ ඒ ධාතු මේ මේ ගණයෙහි යයි දැන ක්‍රියාසිද්ධකටයුතු.

ඒ ඒ ගණවල ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර හෙවත් පච යනා දි ධාතු මූලටත් "ති" ආදී විභක්ති ප්‍රත්‍යය අගටත් යොදා ක්‍රියා විශෙෂ පෙන්වන පිණ්ස මැද යොදනලද "අ" ආදි ප්‍රත්‍යය විකරණප්‍රත්‍යයෝයි-ඒප්‍රත්‍යයෝ ගණ වසයෙන් කර්තෘකාරක යෙහි මවෙත්-සියළුම ගණවල කර්මකාරකයෙහි "ය" ප්‍රත්‍යයයි-මෙය ආධුනිකයන්ගේ ක්‍රියා ඉගෙණ ගැන්මට කරණලද පොතක් හෙයින් සුඛාවගාහය සඳහා ගණ භෙදවසයෙන් විශෙෂය විස්තර නොකොට සංක්ෂෙප කරණලදී—එහෙයින් ගණවස යෙන් දික්වූ ක්‍රියාමාලාද නොයොදනලදී—මෙයින් වෘද්ධියට පැමිණ බාලාවතාර රූපසිද්ධි කාත්‍යායනාදිය අවබොධයට පත්වූකලැ විශෙෂයෙන් අවබොධ කිරීම සුකරවේ.

නිමී.

---

මනොරමාබන්ධ විචිත්‍ර මාලිකා
ධතා සියා යා 'ධූනිකෙහි සාධුකං,
අයං සුධී සංඛත සාධු වණ්ණනා
කාරෙ සු තෙසං තිල දප්පණායතු.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු